# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2366/39 - 2024 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2024.01.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනත**

අංක 02/2024 දරන සුරාබදු නිවේදනය

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වන වගන්තිය සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් සාදන ලද රීති 2024 ජනවාරි මස 12 දින සිට බලාත්මක බව ප්‍රකාශ කරමි.

2008 අප්‍රේල් මස 10 වන දිනැති අංක 1544/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ අංක 902 දරන සුරාබදු නිවේදනය හා 2015 දෙසැම්බර් මස 15 වන දිනැති අංක 1945/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ අංක 983 දරන සුරාබදු නිවේදනයේ (2) වන ඡේදයෙහි අන්තර්ගත විධිවිධාන මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

1A - PG 6621 — 454 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

1. මෙම රීති "සුරාබදු නිවේදන අංක 02/2024" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2. මෙහි මින් මතු "ආඥාපනත" යනුවෙන් හඳුන්වනු ලබන (52 වන අධිකාරය වූ) 1912 අංක 08 දරන සුරාබදු ආඥාපනත ප්‍රකාරව,

I. මෙම රීති ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ එදිනට පසුව, තත්කාලයෙහි නිකුත් කරනු ලබන ඕනෑම මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සියලු තැනැත්තන් විසින් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රය මඟින් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතුය.

II. දැනට ක්‍රියාත්මක වන මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් එළඹෙන වර්ෂය සඳහා අළුත් කරවා ගැනීමට අදහස් කරන සියලු තැනැත්තන් විසින් මේ රීතිවල II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රය මඟින්ද, යම් මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක සම බලපත්‍රධාරිත්වය අයදුම් කරන්නෙකු විසින් මේ රීතිවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රය මඟින්ද, යම් මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක අයිතිය පැවරීමට අදහස් කරන සියලු තැනැත්තන් විසින් මේ රීතිවල IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රය මඟින් ද, එවැනි කිසියම් බලපත්‍රයක් ස්ථාන මාරු කිරීමට අදහස් කරන සියලු තැනැත්තන් විසින් මේ රීතිවල V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රය මඟින් ද, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතුය.

III. මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් අළුතින් ඉල්ලුම් කිරීම, දැනට පවතින එවැනි බලපත්‍රයක වලංගු කාලසීමාව දීර්ඝ කිරීම, එවැනි බලපත්‍රයක අයිතිය පැවරීම, එවැනි බලපත්‍රයක සමබලපත්‍රධාරිත්වය සඳහා අයදුම් කිරීම හෝ බලපත්‍ර ලත් ස්ථානය ස්ථාන මාරු කිරීම යන අවස්ථාවන්හි දී රුපියල් 25,000.00 ක මුදලක් ආපසු ප්‍රතිපූර්ණය කරනු නොලබන ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ලෙස ගෙවිය යුතුය.

IV. එසේද වුවත්, සුරාබදු ර.බී. 14 අවස්ථා බලපත්‍රය, සුරාබදු ර.බී. 15 විකුණන වේලාවන් දීර්ඝ කිරීමට දෙන අතිරේක බලපත්‍රය හා සුරාබදු ර.බී. 16 වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය යන මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් ඉහත III ඡේදයෙහි සඳහන් ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ගෙවීම අදාළ නොවිය යුතුය.

V. මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් අළුතින් ඉල්ලුම් කිරීම, එවැනි බලපත්‍රයක හිමිකාරිත්වය පැවරීම සහ එවැනි බලපත්‍රයක සමබලපත්‍රධාරිත්වය සඳහා අයදුම් කිරීම හෝ බලපත්‍ර ලත් ස්ථානය ස්ථාන මාරු කිරීම සඳහා අදාළ වන අයදුම් පත්‍ර, නියමිත ඉල්ලුම්පත්‍ර ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, සුරාබදු ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය. එසේද වුවත්, එවැනි බලපත්‍රයක වලංගු කාලසීමාව දීර්ඝ කිරීම සඳහා අදාළ වන අයදුම්පත්‍ර, සුරාබදු ප්‍රධාන කාර්යාලයෙන් හෝ දිවයින පුරා පිහිටා ඇති සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලවලින් හෝ ලබා ගත හැකිය.

VI. මෙම රීතිවල විධිවිධාන පරිදි ලබාගත් අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛන ද සමඟ නව බලපත්‍ර සම්බන්ධයෙන් වන විට එකී බලපත්‍රය සඳහා යෝජිත ස්ථානය පිහිටා ඇති සුරාබදු බල ප්‍රදේශයේ නැතහොත් දැනටමත් පවත්නා බලපත්‍ර සම්බන්ධයෙන් වන විට එකී බලපත්‍ර ලත් ස්ථානය පිහිටා ඇති සුරාබදු බල ප්‍රදේශයේ සුරාබදු ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

VII. කෙසේ වෙතත්, සුරාබදු කොමසාරිස් ජනරාල්ට ඕනෑම ඉල්ලුම්කරුවෙකුට අදාළ ඕනෑම තොරතුරක් සුරාබදු දෙපාර්තමේන්තුවේ ඇති ඕනෑම ලිපි ගොණුවක් බලා උපුටා ගැනීමට හෝ ඉල්ලුම්කර ඇති බලපත්‍රය නිකුත් කිරීම ගැන සළකා බැලීම සඳහා ඉල්ලුම්කරුගේ ආදායම් බදු හෝ වෙනත් බදු ගෙවන ලද විස්තර ඇතුළුව අවශ්‍ය ඕනෑම තොරතුරක් ඉල්ලා ගෙන්වා ගැනීමේ අයිතිය ඇත්තේය.

VIII. ඉහත VI වන උප වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතු අතර, අවශ්‍ය සියලුම ලේඛන ඒ සමඟ අමුණා තිබිය යුතුය. අසම්පූර්ණ හෝ අවශ්‍ය ලේඛන නොමැතිව ඉදිරිපත් කරන ලද හෝ මේ රීතිවල VI වන උපලේඛනයේ දක්වා ඇති මාර්ගෝපදේශ හෝ කොන්දේසිවලට අනුකූල නොවන ලෙස ඉදිරිපත් කරන ලද හෝ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IX. කෙසේ වුව ද, මෙම වගන්තියෙහි විධිවිධාන පරිදි යම් ඉල්ලුම්පත්‍රයක් නිකුත් කිරීම, එකී ඉල්ලුම් පත්‍රය මගින් අයදුම්කරනු ලබන මත්පැන් විකිණීමේ නව සුරාබදු බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් හෝ සුරාබදු බලපත්‍රයක හිමිකාරිත්වය පැවරීම හෝ බලපත්‍රයක සමබලපත්‍රධාරිත්වයට පත් කිරීම නැතහොත් බලපත්‍රලත් ස්ථානයක් ස්ථාන මාරු කිරීමට අනුමැතිය දීම සිදු කරනු ලබන බවට නිකුත් කරන සහතිකයක් නොවේ.

3. ඉහත 2 වන රීතිය යටතේ වන සියලුම ඉල්ලීම් ලැබීමේදී, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් සුරාබදු ආඥාපනතේ විධිවිධාන අනුව එම ඉල්ලුම් පත්‍ර සළකා බලා එම ඉල්ලුම් පත්‍ර මේ රීතිවල VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ සහ කොන්දේසිවලට අනුකූල බවට සෑහීමකට පත්විය යුතුය.

4. මේ රීති යටතේ මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් අළුතින් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී මෙන්ම දැනටමත් ප්‍රදානය කර ඇත්තා වූ එවැනි බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කරනු ලබන අවස්ථාවක දී ද අදාළ බලපත්‍රලාභියා විසින්, තත්කාලයෙහි එකී බලපත්‍ර වර්ගය සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති බලපත්‍ර ගාස්තු ගෙවනු ලැබිය යුතුය.

5. මත්පැන් විකිණීමේ සියලුම සුරාබදු බලපත්‍ර ලිත් වර්ෂ 01 ක කාලයක් ( ජනවාරි 01 සිට දෙසැම්බර් 31) සඳහා නිකුත් කරනු ලබන අතර, අදාළ මුදල් වර්ෂය ආරම්භ වන දිනයට යටත් පිරිසෙයින් වැඩ කරන දින හතකට පෙරාතුව එම වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුය. එසේ වුවද, අදාළ මුදල් වර්ෂය ආරම්භ වී යටත් පිරිසෙයින් වැඩ කරන දින හතක් ඇතුළත, අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත එම බලපත්‍ර ගාස්තුව ලැබී නොමැති විටදී එකී බලපත්‍ර ගාස්තුවෙන් 1% ක දඩ මුදලකට යටත්ව සති හතරක කාල සීමාවක් ඇතුළත එම බලපත්‍ර ගාස්තු ගෙවීමට අවසර ලබාදිය යුතුය. එම සති හතරක කාලසීමාව ගත වූ පසුව ඉහත කී දඩය බලපත්‍ර ගාස්තුවේ වටිනාකමින් 3% ක් විය යුතුය.

6. වර්ෂය මැද යම් අවස්ථාවක දී නිකුත් කරනු ලබන බලපත්‍ර එම අවුරුද්දේ ඉතිරි කාලයට පමණක් නිකුත් කරනු ලැබේ. එසේ වර්ෂය මැද දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් එම වසරේ ඉතිරි කාලයට ප්‍රමාණුකූල ලෙස බලපත්‍ර ගාස්තු අය කරනු ලැබිය යුතුය.

7. එසේම දැනටමත් ප්‍රදානය කර ඇත්තා වූ කිසියම් මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක අයිතිය පවරනු ලබන, එවැනි බලපත්‍රයක සමබලපත්‍රධාරීත්වයට පත් කරනු ලබන හෝ එකී බලපත්‍රය ස්ථානමාරු කරනු ලබන සෑම තැනැත්තකු විසින්ම, තත්කාලයෙහි ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන ගාස්තු ගෙවනු ලැබිය යුතුය :-

බලපත්‍රයක් ස්ථාන මාරු කිරීමේ ගාස්තුව -රු. 250,000/-

සුරාබදු ර.බී. 4 බලපත්‍රයක් පැවරීමේ හෝ සමබලපත්‍රධාරීත්වයට පත් කිරීමේ ගාස්තුව

නෛතික උරුමකරුවෙකු සඳහා -රු. 250,000/-
නෛතික උරුමකරුවෙකු නොවන්නෙකු සඳහා -රු. 15,000,000/-

සුරාබදු ර.බී. 4 නොවන බලපත්‍රයක් පැවරීමේ හෝ සමබලපත්‍රධාරීත්වයට පත් කිරීමේ ගාස්තුව
නෛතික උරුමකරුවෙකු සඳහා -රු. 250,000/-
නෛතික උරුමකරුවෙකු නොවන්නෙකු සඳහා -රු. 2,500,000/-

8. සාමාන්‍ය වශයෙන් ගත්කල යම් වර්ෂයක ජනවාරි මස 01 වැනි දිනයෙන් ආරම්භවී එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් ලිත් වර්ෂයක් සම්බන්ධයෙන් මෙන්ම යම් සුවිශේෂ හේතුවක් මත කිසියම් වර්ෂයක ආරම්භක දිනයෙන් පසු දිනයකින් ආරම්භ වී එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයෙන් නැතහොත් ඊට පෙර දිනයකින් අවසන් වන කාලසීමාවක් සම්බන්ධයෙන් මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම මෙම මාර්ගෝපදේශ සහ කොන්දේසි වෙනස්වනතුරු හෝ පරිච්ඡින්න කරනතුරු අදාළ විය යුතුය.

9. මත්පැන් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම සුරාබදු ආඥාපනත මගින් නියම කර ඇති පරිදි තම බලපත්‍රයේ වලංගු කාලසීමාව ආවරණය වන පරිදි ප්‍රතිරූප ගිවිසුමක් ලියා අත්සන්කල යුතු වේ. තවද, ඉල්ලුම් කරනු ලබන මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍ර වර්ගය සම්බන්ධයෙන් තත්කාලයෙහි බලපවත්නා වූ ආරක්ෂිත ඇප තැන්පතු ඔහුගේ ගිවිසුම යථා පරිදි ඉටු කිරීම සඳහා ඇපයක් වශයෙන් තැන්පත්කළ යුතුය.

10. ඉල්ලුම්කරුට මත්පැන් බලපත්‍රයක් ප්‍රදානය කිරීම සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, එවැනි අදහසක් දැරීමට ඔහුට ඇති හේතුන්, අදාළ ඉල්ලුම්පත ලැබී දින 30 ක් ඇතුළත දී ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු අතර, තමන්ට බලපත්‍රයක් දීම යුක්ති සහගත යැයි දැක්වීමට හේතු ඉල්ලුම්කරුට ඇත්නම්, එම හේතුන් දක්වන ලෙසට දැන්විය යුතුය. ඒ අනුව, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ දැන්වීම ලැබී සති දෙකක් ඇතුළත, තමන් ඉදිරිපත් කරන කරුණු තහවුරු කිරීමට ලේඛන ඇත්නම් ඒවා ද ඉදිරිපත් කරමින් සුරාබදු කොමසාරිස් ජනරාල් දැක්වූ හේතුවලට විරුද්ධව ඇති හේතුන් ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් ඔහු වෙත යොමු කළ යුතුය.

11. සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ඉන් පසුව, සහ ඉල්ලුම්කරුගෙන් පිළිතුරු ලිපියක් ලැබුණු දිනෙන් දින 30 කට ප්‍රමාද නොවන කාලසීමාවක් ඇතුළත, සියලු කරුණු සළකා බලා අවස්ථානුකූල අවශ්‍ය හා සුදුසු යැයි පෙනී යන්නේ නම් සිය අභිමතය පරිදි පරීක්ෂණයක් පවත්වා, අයදුම්කරුට මත්පැන් බලපත්‍රයක් නිකුත් කළ යුතු ද යන්න තීරණය කිරීම හෝ එවැනි බලපත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම සනාථ කිරීම කළ යුතුය. එසේ ගත් තීරණය නොපමාව ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

12. මත්පැන් විකිණීම පිණිස බලපත්‍රයක් ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස එම බලපත්‍රය සඳහා යෝජිත ස්ථානයේ පිහිටීම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් පහත දැක්වෙන අවශ්‍යතාවන් සපුරාලිය යුතුවේ:

(අ) ස්ථානීය පරිභෝජනය සඳහා නොවන මත්පැන් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන අවම වශයෙන් වර්ග අඩි 250 ක ගෙබිම් ඉඩකඩකින් ද, ස්ථානීය පරිභෝජනය සඳහා මත්පැන් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන අවම වශයෙන් වර්ග අඩි 500 ක ගෙබිම ඉඩකඩකින් ද සමන්විත විය යුතුය.

(ආ) ස්ථානීය පරිභෝජනය සඳහා නොවන බියර්, ඒල්, ස්ටවුට් හා වයින් වර්ග පමණක් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍ර ලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන අවම වශයෙන් වර්ග අඩි 100 ක ගෙබිම් ඉඩකඩකින් ද, ස්ථානීය පරිභෝජනය සඳහා බියර්, ඒල්, ස්ටවුට් හා වයින් වර්ග පමණක් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍ර ලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන අවම වශයෙන් වර්ග අඩි 250 ක ගෙබිම ඉඩකඩකින් ද සමන්විත විය යුතුය.

(ඇ) තම සමාගමේ/ ව්‍යාපාරයේ හෝ මව් සමාගමේ / ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 1000 ක් ඉක්මවන වෙළෙඳ සංකීර්ණ/ වෙළඳසැල් වැනි ආයතනයන්ට ලබාදෙන ස්ථානීය පරිභෝජනය සඳහා නොවන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන අවම වශයෙන් වර්ග අඩි 3,000 ක සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන ආකාරයට පාරිභෝගික සේවා සැපයීමේ ගෙබිම් ඉඩකඩකින් සමන්විත විය යුතුය.

(ඈ) මත්පැන් තොග වෙළෙඳ බලපත්‍ර සඳහා අවම වශයෙන් වර්ග අඩි 1000 ක ගෙබිම් ඉඩකඩකින් සමන්විත විය යුතුය.

(ඉ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවන සුරාබදු ර.බී. 07 හෝටල් බලපත්‍ර, සුරාබදු ර.බී. 08 හෝටල් පීයිකා බලපත්‍ර, සුරාබදු ර.බී. 11 ආපනශාලා සහ සුරාබදු ර.බී. 12 තානායම් බලපත්‍ර යන ස්ථානීය පරිභෝජනය සඳහා මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථානවල පරිශ්‍රයේ පිහිටීම හා ස්ථානගත කිරීම මෙහි VII වන උපලේඛනයේ දැක්වෙන නිර්ණායකවලට අනුකූලව සිදුකළ යුතුය. එකී හෝටල් බලපත්‍ර, ආපනශාලා බලපත්‍රවලින් වෙන් කර සලකනු ලබන්නේ, ආගන්තුකයන්ගේ නවාතැන් සඳහා එම හෝටල සතුව අවම වශයෙන් කාමර පහක් (05) වත් ඇත්නම් පමණි.

(ඊ) ස්ථානීය පරිභෝජනය සඳහා නොවන මත්පැන් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන පිහිටුවා ගැනීම කළ යුත්තේ ඒවායේ ආසන්නතම මායිමේ සිට රජයේ ලියාපදිංචි පාසල් සහ රජයේ ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානවල ආසන්නතම මායිමට ඇති කෙළින් දුර මීටර් සියය (100) ඉක්මවන පරිදි වේ. තවද, ස්ථානීය පරිභෝජනය සඳහා මත්පැන් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන පිහිටුවා ගැනීම කළ යුත්තේ ඒවායේ ආසන්නතම මායිමේ සිට රජයේ ලියාපදිංචි පාසල් සහ රජයේ ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානවල ආසන්නතම මායිමට ඇති කෙළින් දුර මීටර් පන්සියය (500) ඉක්මවන පරිදි වේ.

(උ) රජයේ ලියාපදිංචි පාසල් සහ රජයේ ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලට තිබිය යුතු දුර නිශ්චිත දුර ප්‍රමාණ කඩකර ඇති බවට යම් පැමිණිල්ලක් ලැබුණහොත්, බලපත්‍ර අයදුම්කරු විසින් අදාළ මැනුම් ගාස්තු ගෙවීමට යටත්ව රජයේ මිණින්දෝරු අධිකාරිගෙන් ලබාගන්නා වූ මැණුම් වාර්තාවක් මගින් සත්‍ය දුර ප්‍රමාණයන් නිර්ණය කරගත යුතුය. එම මැණුම් වාර්තාවට අනුව දුර ප්‍රමාණ පිළිබඳ රීති උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වුවහොත් අදාළ බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතුය.

(ඌ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ, නාගරික සංවර්ධන අධිකාරියේ, ජාතික චිත්‍රපට සංස්ථාවේ හෝ 1975 අංක 17 දරන සමාජශාලා පනත යටතේ අදාළ පළාත් පාලන ආයතනයන්හි ලියාපදිංචිය ලත් ස්ථානීය පරිභෝජනය සඳහා මත්පැන් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන පිහිටුවා ගැනීම කළ යුත්තේ ඒවායේ ආසන්නතම මායිමේ සිට රජයේ ලියාපදිංචි පාසල් සහ ප්‍රසිද්ධ පූජනීය ස්ථානවල ආසන්නතම මායිමට ඇති කෙළින් දුර මීටර් දෙසිය පනහ (250) ඉක්මවන පරිදි වේ.

(එ) එසේද වුවත්, ස්ථානීය පරිභෝජනය සඳහා මෙන්ම ස්ථානීය නොවන පරිභෝජනය සඳහා බියර් ඒල්, ස්ටවුට් හා වයින් වර්ග පමණක් සිල්ලරට විකිණීම පිණිස වන බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථාන පිහිටුවා ගැනීම කළ යුත්තේ ඒවායේ ආසන්නතම මායිමේ සිට රජයේ ලියාපදිංචි පාසල් සහ ප්‍රසිද්ධ පූජනීය ස්ථානවල ආසන්නතම මායිමට ඇති කෙළින් දුර මීටර් සියය (100) ඉක්මවන පරිදි වේ.

(ඒ) මත්පැන් තොග වෙළඳ බලපත්‍ර සඳහා මෙම දුර ප්‍රමාණ අවශ්‍යතාවන් අදාළ නොවිය යුතුය.

(ඔ) ඇ. එ. ජ. ඩොලර් මිලියන 5 ක් ඉක්මවන ආයෝජනයන් සහිත වාණිජ කටයුතු අරමුණු කරගත්, පාලිත පිවිසුම් සහිත වූ හෝ නිශ්චිත සාමාජික හෝ පාරිභෝගික ප්‍රජාවක් සඳහා පමණක් වෙන්වූ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, සංචාරක කළාප, ආර්ථික කළාප, ආයෝජන කළාප, හා වාසස්ථාන සංකීර්ණ ආශ්‍රිත විනෝදාස්වාදන මධ්‍යස්ථාන, යම් වාණිජ ගොඩනැගිලි සංකීර්ණයක තුන්වන මහලේ සිට ඉහළට පිහිටා ඇති අළෙවිසැල් යන ස්ථාන සම්බන්ධයෙන් ද මෙම දුර ප්‍රමාණ අවශ්‍යතාවන් අදාළ නොවිය යුතුය.

(ඕ) එසේද වුවත්, දැනටමත් නිකුත් කර ඇති පහත සඳහන් ගණයන්ට අයත් සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් මහජනයා විසින් නිශ්චිත වශයෙන් විරෝධතාවයන් නොදක්වන බවට සෑහීමකට පත්වන්නේ නම් ඉහත දක්වන ලද දුර ප්‍රමාණ අවශ්‍යතාවන් ලිහිල් කිරීම සම්බන්ධයෙන් සළකා බැලීමට සුරාබදු කොමසාරිස් ජනරාල්ට හැකිය.

I. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිතව පිහිටුවා ඇති බලපත්‍ර
II. එකම ස්ථානයේ වසර 10 කට වැඩි කාලයක් පවත්වාගෙන ගිය බලපත්‍ර
III. පාසල් හා පූජනීය ස්ථාන පිහිටුවීමට පෙර ස්ථාපිත කරන ලද බලපත්‍ර

13. බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර හෝ නිකුත් කිරීමෙන් පසුව හෝ යම් මහජන සංවිධානයක සාමාජිකයෙකු විසින් එම සංවිධානය නියෝජනය කරමින්, එකී බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් සුරාබදු ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනය වී ඇති බවට හෝ මෙහි දැක්වෙන රීති, මාර්ගෝපදේශ හා කොන්දේසි උල්ලංඝනය වී ඇති බවට ලිඛිත පැමිණිල්ලක් හෝ පැමිණිලි සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණහොත් ඒ බව ඉල්ලුම්කරුට නැතහොත් බලපත්‍රලාභියාට දන්වා එකී පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණයක් තමන් විසින් හෝ ඒ සඳහා තමන් විසින් බලය පවරන ලද සුරාබදු නිලධාරියෙකු මඟින් සිදුකිරීමෙන් අනතුරුව, එම පරීක්ෂණයෙහි ප්‍රතිඵල මත තීරණයකට එළඹෙනු ඇත.

14. ඉහත 11 වැනි රීතියෙහි විධිවිධාන ප්‍රකාරව පරීක්ෂණයට පාදක වූ බලපත්‍රලත් ස්ථානය පවත්වාගෙන යාම හෝ යෝජිත ස්ථානය පිහිටුවීම හෝ හේතුකොට ගෙන එම ප්‍රදේශයේ නීතිය හා සාමය පවත්වාගෙන යාමට බාධා ඇති වන බවට එවැනි පරීක්ෂණයකදී නිශ්චිතවම අනාවරණය වන්නේ නම්, එම බලපත්‍ර ස්ථානය නැතහොත් යෝජිත ස්ථානය ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සුරාබදු කොමසාරිස් ජනරාල්ට හැකිය.

15. තවද, ඉහත 11 සහ 12 වන රීතිවල විධිවිධාන ප්‍රකාරව පවත්වනු ලබන පරීක්ෂණයන්ගෙන් අනතුරුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සම්බන්ධයෙන් ගනු ලබන තීරණ අවසානාත්මක විය යුතුය.

## I වන උපලේඛනය

### නව මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රය

**බලපත්‍රයේ වලංගු කාලය ......................... සිට ......................... දක්වා**

අයදුම්පත් ගාස්තුව ගෙවූ ලදුපත් අංකය හා දිනයඃ...............................................................

අයදුම්පත නිකුත් කළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාවඃ .............................................

| | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි |
|---|---|
| ඉල්ලුම්පත හැකිතාක් දුරට නිවැරැදිව ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.<br><br>(අ) අදාළ නොවන විකල්පය කපා හැරීමෙන් හෝ (ආ) අදාළ විස්තර පිරවීමෙන් හෝ (ඇ) දැනට අදාළ නොවන්නේ නම් "අදාළ නොවේ" යැයි සඳහන් කරමින් හෝ සම්පූර්ණ කිරීමට | සුරාබදු සත්‍යාපන ක්‍රියාවලිය<br><br>සුරාබදු පරීක්ෂක විසින් සම්පූර්ණ කිරීමට<br><br>(හරි නම් √ ලකුණ යොදන්න; වැරදි නම් විස්තර සපයන්න) |
| 1. ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන් පිළිබඳ සාමාන්‍ය විස්තර | ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| **ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ නමඃ-**<br>...........................................................................................<br>...........................................................................................<br>...........................................................................................<br>...........................................................................................<br><br>ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ ලිපිනය/ ලිපිනයන්ඃ-<br>...........................................................................................<br>...........................................................................................<br>...........................................................................................<br>...........................................................................................<br><br>දුරකථන/ ෆැක්ස් ඃ-...................................<br><br>විද්‍යුත් තැපැල ඃ-...................................................................<br><br>ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකයඃ-...........................<br>(අදාළ වේ නම්) | <br>......................................<br>......................................<br>......................................<br>......................................<br><br><br>......................................<br>......................................<br>......................................<br>......................................<br><br>......................................<br><br>...................................... |
| ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපතක් (අදාළ වේ නම්)<br>1 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | ...................................... |
| ජාතියඃ ......................................<br>ජාතික හැඳුනුම්පත් අංකයඃ ......................................<br>වයසඃ- ......................................<br>රැකියාවඃ- ...................................... | ......................................<br>......................................<br>......................................<br>...................................... |
| ජාතික හැඳුනුම් පතෙහි/ විදේශ ගමන් බලපතෙහි/ රියදුරු බලපතෙහි ඡායාස්ථ පිටපතක්<br>2 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | ...................................... |

| 2. බලපත්‍රයට/ බලපත්‍රවලට අදාළ විස්තර | | | ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
|---|---|---|---|
| බලපත්‍ර වර්ගය | බලපත්‍රයේ ස්වභාවය | | ......................................<br>......................................<br>......................................<br>...................................... |
| සුරාබදු ර.බී ................ | ස්ථානයෙන් පිටත පරිභෝජනය | ස්ථානීය පරිභෝජනය | |
| (අ) ර.බී.7 හෝටල් බලපත්‍රයක් නම්, කාමර ගණනා:- | | ...................... | ...................................... |
| (ආ) ඉල්ලුම්කරු වෙනත් සුරාබදු බලපත්‍ර දරන්නේ ද ? | ඔව් | නැත | ...................................... |

| "ඔව්" නම් බලපත්‍ර වර්ගය | | එම බලපත්‍ර ක්‍රියාත්මකවන පරිශ්‍රය | |
|---|---|---|---|
| i | ...................... | ...................................... | ...................................... |
| ii | ...................... | ...................................... | ...................................... |
| iii | ...................... | ...................................... | ...................................... |
| iv | ...................... | ...................................... | ...................................... |

(ඇ) පවත්නා වර්ෂය තුළ දී මෙම ස්ථානයේ මත්පැන් බලපත්‍රයක් ක්‍රියාත්මක වී තිබේ ද?
......................................

"ඔව්" නම්,

I. බලපත්‍රධාරියාගේ නම සහ ලිපිනය:-................................ ......................................
( ඉහත සඳහනට වෙනස් නම්) :-...................................... ......................................

........................................................................................ ......................................
........................................................................................ ......................................
........................................................................................ ......................................
........................................................................................ ......................................

II. මෙම පරිශ්‍රයට අදාළව බලපත්‍රය ක්‍රියාත්මකව තිබූ මුළු කාලය :
...................................... ......................................

III. බලපත්‍රය ආරම්භ වූ වර්ෂය : ...................................... ......................................

| 3. ඉල්ලුම්කරු බලපත්‍රය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන පරිශ්‍රයේ භූගෝලීය පිහිටීම පිළිබඳ විස්තර | ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
|---|---|
| යෝජිත ස්ථානයේ තැපැල් ලිපිනය:- ....................................................<br>........................................................................................<br>........................................................................................<br>........................................................................................ | ...................................... |

| | |
|---|---|
| දිස්ත්‍රික්කයඃ- ........................................... | ................................... |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයඃ- ........................................... | .................................. |
| පොලිස් වසමඃ- ........................................... | ................................... |
| මැතිවරණ කොට්ඨාශයඃ- ........................................... | ................................... |
| සුරාබදු ස්ථාන බල ප්‍රදේශයඃ- ........................................... | ................................... |

| 4. පිහිටීම අනුව පරිශ්‍රයේ සුදුසුභාවය පිළිබඳ විස්තර | | | | ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
|---|---|---|---|---|
| (අ) බලපත්‍ර වර්ගයට නියමිත දුර ප්‍රමාණයට වඩා පහත සඳහන් ස්ථානවලට ඇති දුර ප්‍රමාණය වැඩි වන්නේ ද? | රජයේ ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථාන | ඔව් | නැත | ..................................... |
| | රජයේ ලියාපදිංචි පාසැල් | ඔව් | නැත | ..................................... |
| 3 වන ඇමුණුම ලෙස, බලපත්‍රලත් මිනින්දෝරුවෙකුගෙන් ලබාගත් මිනින්දෝරු සැළැස්මක් ඉදිරිපත් කරන්න. | | | | ..................................... |
| (ආ) පරිශ්‍රය පිහිටා ඇත්තේ රටබීම තැබෑරුම් ප්‍රදේශයක් ඇතුළත ද? .......... | | | | ..................................... |
| (ඇ)"ඔව්" නම්, ළඟම ඇති රටබීම තැබෑරුමේ සිට ඇති දුරඃ-.................... | | | | ..................................... |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) සමාජශාලා බලපත්‍ර දරන්නන් සඳහා -අදාළ නම් පමණක් සම්පූර්ණ කරන්න | i. ඔබ 1975 අංක 17 දරන සමාජශාලා පනත යටතේ ලියාපදිංචි වී ඇත්තේ ද? | ඔව් | නැත | ..................................... |
| | ii. ඔබ ක්‍රීඩා අමාත්‍යාංශය/ සමාජ සේවා අමාත්‍යාංශය සමඟ ලියාපදිංචි වී ඇත්ද? | ඔව් | නැත | ..................................... |
| | iii. පසුගිය වර්ෂ 5 තුළ සක්‍රියව ක්‍රියාත්මක වී ඇත් ද? | ඔව් | නැත | |
| | iv. අයදුම් කරන වසරට වලංගු සමාජ ශාලා බලපත්‍රයක් තිබේද? | ඔව් | නැත | ..................................... <br> ..................................... |
| | v. ඔබ බැංකු ගිණුමක් දරන්නේ ද? | ඔව් | නැත | ..................................... |
| 4 වන ඇමුණුම ලෙස, යෝජිත බලපත්‍රය නිකුත් කිරීම සඳහා මහජනයාගේ විරුද්ධතාවක් නොමැති බවට අදාළ පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කරන්න. | | | | |

| 5. දෙවන පාර්ශවයක ලියාපදිංචිය/ නිර්දේශය පිළිබඳ තොරතුරු | | | ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 7,8,11,12,22බී බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | .................................... |
| (ආ) ජාතික චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 9 බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | .................................... |
| (ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 12 බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | .................................... |
| (ඈ) අදාළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 13 හා 13ඒ බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | .................................... |
| (ඉ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 10 බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | .................................... |
| (ඊ) වෙනත් අදාළ ආයතනවල ලියාපදිංචිය/නිර්දේශය (අදාළ වේ නම් පමණක්) | ඔව් | නැත | .................................... |

| | | | |
|---|---|---|---|
| "ඔව්" නම්, අදාළ ලියාපදිංචිය/නිර්දේශය සනාථ කරන ලේඛන 5 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | | | ................................ ...... |
| **6. සාපරාධී පසුබිම පිළිබඳ විස්තර** | | | ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| (අ) සාපරාධී අපරාධ හෝ සුරාබදු අපරාධ කිසිවක් සඳහා ඔබ වරදකරු වී තිබේ ද? | ඔව් | නැත | ..................................... |
| (ආ) යෝජිත පරිශ්‍රයෙහි සාපරාධී අපරාධ හෝ සුරාබදු අපරාධ සිදුකරන ලද බවට වාර්තා තිබේ ද? | ඔව් | නැත | ..................................... |
| (ඇ) සුරාබදු බලපත්‍ර දැරීම සම්බන්ධයෙන් ඔබ අපලේඛනගත කොට තිබේ ද? | ඔව් | නැත | ..................................... |
| ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් 6, 7, 8, 9, හා 10 වන ඇමුණුම් මගින් විමසා ඇති ප්‍රකාශ, වාර්තා හා විස්තර සපයන්න. | | | ..................................... |
| (ඈ) පසුගිය වර්ෂ 3 ක් තුළදී ඔබට අදාළව යම් සුරාබදු බලපත්‍රයක් සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කර තිබේ ද? "ඔව්" නම් විස්තර සපයන්න. | ඔව් | නැත | ..................................... |

| වර්ෂය | කාර්මික අපරාධ වාර්තා අංකය | සමථ ගාස්තුව | |
|---|---|---|---|
| | | | ..................................... |
| | | | ..................................... |
| | | | ..................................... |

| | | | | | |
|---|---|---|---|---|---|
| **7. යෝජිත පරිශ්‍රයෙහි අයිතිය පිළිබඳ සාක්ෂි, පාවිච්චිය සඳහා අනුමැතිය සහ පරිශ්‍රය පිළිබඳ විස්තර** | | | | | ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| (අ) අයිතියේ ස්වභාවයඃ- | සින්නක්කර | බදු | කුලියට | වෙනත් | |
| ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු විසින් සහතික කළ ලියාපදිංචි කල ඔප්පුවේ/ කුලී හෝ බදු ගිවිසුමේ පිටපතක් 11 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | | | | | ..................................... |
| (ආ) අයිතිය පිළිබඳ ආරවුලක් තිබේ ද? | ඔව් | | නැත | | ..................................... |
| "ඔව්" නම් 12 වන ඇමුණුම හි විස්තර සපයන්න. | | | | | ..................................... |
| (ඇ) කුලියට හෝ බද්දට ගෙන ඇති විට, අයිතිකරු විසින් පරිශ්‍රයෙහි බලපත්‍රය පවත්වා ගෙන යාමට එකඟතාවය ලබාදී ඇත් ද? | ඔව් | | නැත | | ..................................... |
| "ඔව්" නම්, 13 වන ඇමුණුම ලෙස, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු සහතික කළ අනුමැතිය හෝ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරන්න. | | | | | ..................................... |
| (ඈ) යෝජිත පරිශ්‍රය, ගොඩනැගිල්ලේ කුමන ස්ථානයක පිහිටියේ ද? | සම්පූර්ණ ගොඩනැගිල්ල | | ගොඩනැගිල්ලේ කොටසක / මහලක | | ..................................... |
| (ඉ) ගොඩනැගිල්ලේ කොටසක නම්, අනෙකුත් තැන් පාවිච්චි කරනුයේ කුමකටදැයි දැක්වෙන මුළු සැලැස්මේ කටු සටහනක් 14 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න | | | | | ..................................... |

<table>
<tr><td colspan="5">(ඊ) බලපත්‍ර පරිශ්‍රයේ මායිම්:-<br><br>උතුරට : ........................................................................................<br><br>දකුණට : ........................................................................................<br><br>නැගෙනහිරට : ..............................................................................<br><br>බටහිරට: ........................................................................................</td><td>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................</td></tr>
<tr><td colspan="5">(උ) බලපත්‍ර පරිශ්‍රය තුළ ස්ථාපිත මත්පැන් ගබඩාවෙහි/ මත්පැන් පීඨිකාවෙහි මායිම්:-<br><br>උතුරට : ........................................................................................<br><br>දකුණට : ........................................................................................<br><br>නැගෙනහිරට : ..............................................................................<br><br>බටහිරට: ........................................................................................</td><td><br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................</td></tr>
<tr><td colspan="5">(ඌ) ගොඩනැගිල්ලේ විස්තරය පිළිබඳ සහතිකකළ දළ සටහනක් 15 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.</td><td>........................................</td></tr>
<tr><td rowspan="4">(එ)ගොඩනැගිල්ලේ විස්තරය<br><br>(අදාළ නොවේ නම් කපා හරින්න.)</td><td>බිම</td><td>සිමෙන්ති</td><td>ටයිල්</td><td>වෙනත්</td><td rowspan="5">ගොඩනැගිල්ල සෑම අතින්ම සුදුසුදැයි අදහස් දක්වන්න.<br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................</td></tr>
<tr><td>වහල</td><td>ඇස්බැස්ටෝස්</td><td>උළු</td><td>වෙනත්</td></tr>
<tr><td>බිත්ති</td><td>ගඩොල් සහ බදාම</td><td>පෙර නිමි</td><td>වෙනත්</td></tr>
<tr><td colspan="4">දොරවල්, ජනෙල් සහ වෙනත් වාතාශ්‍රය පිවිසුම් පිළිබඳ විස්තර සපයන්න.<br><br>..............................................................................<br>..............................................................................<br>..............................................................................<br>..............................................................................</td></tr>
<tr><td colspan="5">ඉහත පිළිතුර "වෙනත්" නම් 16 වන ඇමුණුම හි විස්තර සපයන්න.</td></tr>
<tr><td colspan="5">(ඒ) ගොඩනැගිල්ලේ වරිපනම් අංකය:- .......................<br>වරිපනම් අංකයක් නොමැති නම්, 17 වන ඇමුණුම හි විස්තර දක්වන්න. ....................................................<br>...........................................................</td><td>................................</td></tr>
<tr><td colspan="5">(ඔ) ගොඩනැගිල්ලේ ගෙබිම් සැළැස්ම සඳහා අනුමැතිය ලබා තිබේද? ....................<br>ප්‍රාදේශීය අධිකාරීන් විසින් සහතික කරන ලද ගෙබිම් සැලැස්ම 18 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.</td><td>...............................</td></tr>
</table>

| 8. වෙනත් අවශ්‍යතාවයන් | ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
|---|---|
| (අ) ආපසු නොගෙවන ඉල්ලුම්පත් ගාස්තුව ගෙවීම සනාථ කරන ලදුපතේ අංකය හා දිනයඃ- ............... ...................................................................................... <br><br> ලදුපත ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය. ලදුපත **19 වන ඇමුණුම** ලෙස ඉදිරිපත් කරන්න. <br><br> (ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචි වී තිබීම සනාථ කරන ලේඛන **20 වන ඇමුණුම** ලෙස ඉදිරිපත් කරන්න. (එම ලේඛන ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය.) <br><br> (ඇ) ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් වෙනත් සුරාබදු බලපත්‍රයක්/ බලපත්‍ර දරන්නේ නම් හෝ දැනටමත් යෝජිත පරිශ්‍රයේ යම් සුරාබදු බලපත්‍රයක් ක්‍රියාත්මක වන්නේ නම් නැතහොත් මීට කලින් එහි යම් සුරාබදු බලපත්‍රයක් ක්‍රියාත්මක වී ඇත්නම් හෝ එකී බලපත්‍රය/ බලපත්‍ර වෙනුවෙන් රජයට ලැබීමට නියමිත සියලුම සමථ ගාස්තු හා ප්‍රමාද ගාස්තු ඇතුළු සියලුම ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීම පිළිබඳව අදාළ සහකාර සුරාබදු කොමසාරිස්ගේ සහතිකය **21 වන ඇමුණුම** ලෙස ඉදිරිපත් කරන්න. | |
| මෙම ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමෙන් පමණක් මට/අපට බලපත්‍රය හිමි නොවන බව සහ ඉහත සඳහන් විස්තර අසත්‍ය බවට සොයාගත් ඕනෑම අවස්ථාවක හෝ සුරාබදු ආඥාපනත යටතේ දැනට බලාත්මක රීති, නියෝග සහ කඩකිරීමක් සිදුකළේ නම්, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නියෝගයෙන් බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළහැකි බව ද, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව ද, බලපත්‍රයක් නිකුත් නොකිරීමෙන් ශ්‍රී ලංකා රජයෙන් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කටයුතු කරන නිලධාරියෙකුගෙන් වන්දි ඉල්ලා සිටීමට මට/අපට හිමිකමක් නොමැති බව ද, මම/අපි දන්නා බව ප්‍රකාශ කර සහතික කරමි./කරමු. <br><br> ................................................................. <br><br> ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ අත්සන <br><br> දිනයඃ- .............................. | සුරාබදු පරීක්ෂකගේ සාමාන්‍ය නිරීක්ෂණ- <br> ......................................... <br> ......................................... <br> ......................................... <br> ......................................... <br> ......................................... <br> ......................................... <br><br> ......................................... <br> සුරාබදු පරීක්ෂකගේ අත්සන. <br><br> දිනයඃ- .............................. |

**නව මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයට අදාළව ඉදිරිපත් කළ යුතු ඇමුණුම්**

(ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය)

| | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි. සුරාබදු පරීක්ෂක විසින් සම්පූර්ණ කළ යුතුය. |
|---|---|
| **අයදුම්කරුගේ අනන්‍යතාවය** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *1 වන ඇමුණුම*<br>ඉල්ලුම්කරුට/ ඉල්ලුම්කරුවන්ට අදාළ ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපතක්<br>*2 වන ඇමුණුම*<br>සුරාබදු බලපත්‍රයෙහි අයිතිය පැවරීමට යෝජිත පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතෙහි/ විදේශ ගමන් බලපතෙහි/ රියදුරු බලපතෙහි ජායාස්ථ පිටපතක් | ................................ |
| **පරිශ්‍රයේ පිහිටීමේ සුදුසුභාවය** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *3 වන ඇමුණුම*<br>ළඟම ඇති පූජනීය ස්ථානය සහ පාසලට ඇති දුර ප්‍රමාණයන් දක්වමින්, බලපත්‍රලත් මිනුම්දෝරුවෙකුගෙන් ලබාගත් මිනුම්දෝරු සැලැස්මක පිටපතක්.<br>*4 වන ඇමුණුම*<br>යෝජිත බලපත්‍රය නිකුත් කිරීම සඳහා මහජනයාගේ විරුද්ධතාවන් ඇත්නම් ඒ පිළිබඳව අදාළ පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක් . | ................................<br><br>................................ |
| **දෙවන පාර්ශවයක ලියාපදිංචිය/ නිර්දේශය (අදාළ වේ නම් පමණි)** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *5 වන ඇමුණුම*<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය/ ජාතික චිත්‍රපට සංස්ථාව/ නාගරික සංවර්ධන අධිකාරිය/ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව/ සහ වෙනත් අදාළ ආයතනවල ලියාපදිංචිය/නිර්දේශය සනාථ කරන ලේඛන. | ................................ |
| **සාපරාධි අපරාධ පිළිබඳ විස්තර** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *6 වන ඇමුණුම*<br>ඉල්ලුම්කරු, තමා දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වරදකට හෝ සුරාබදු වරදකට හෝ චරිත දූෂණයකට සම්බන්ධ වරදකට හෝ ගෙවී ගිය වසර 5 තුළ වරදකරුවකු කරන ලද හෝ නොකරන ලද බවට දිවුරුම් පෙත්සමකින් කරනු ලබන ප්‍රකාශයක් | ................................. |
| *7 වන ඇමුණුම*<br>ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් පසුගිය වර්ෂ (5) කාලය තුළදී අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥාපනත යටතේ වරදකරුවකු වී නොමැති බවට ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් පදිංචි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගෙන් ලබාගත් වාර්තාවක්. | ................................. |
| *8 වන ඇමුණුම*<br>ඉල්ලුම්කරු යෝජිත බලපත්‍රය දැරීමට සුදුසු වුත්, නිසි වූත්, පුද්ගලයෙකු බවට ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක්. | |
| *9 වන ඇමුණුම*<br>(ඇ) යෝජිත පරිශ්‍රයෙහි සිදුකර ඇති සාපරාධී අපරාධ හෝ සුරාබදු අපරාධ පිළිබඳව අධිකරණය මඟින් වරදකරු කිරීම් සිදුකොට ඇත්නම්, ඒ පිළිබද විස්තර පහත දක්වන්න.<br><br>1..........................................<br>2..........................................<br>3..........................................<br>4..........................................<br>5.......................................... | .................................<br>.................................<br>.................................<br>.................................<br>.................................<br>................................. |

| | |
|---|---|
| *10 වන ඇමුණුම*<br>සුරාබදු බලපත්‍ර දැරීම සම්බන්ධයෙන් අයදුම්කරු/ අයදුම්කරුවන් අපලේඛනගත කොට ඇත්නම් ඒ පිළිබඳ විස්තර ................................................................................................................<br>.....................................................................................................................................<br>..................................................................................................................................... | .................................. |
| **පරිශ්‍රය අයිති බවට සාක්ෂි, භාවිතයට අනුමැතිය සහ පරිශ්‍රයේ විස්තර** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *11 වන ඇමුණුම* **- පරිශ්‍රයේ අයිතිය**<br>ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් සහතික කළ, අයදුම්කරන කාල සීමාව සඳහා වලංගු වූ හා ලියාපදිංචි කළ ඔප්පුවේ /කුලී හෝ බදු ගිවිසුමේ පිටපත | .................................. |
| *12 වන ඇමුණුම* **- අයිතිය පිළිබඳ ආරවුල්**<br>යෝජිත ගොඩනැගිල්ලේ අයිතිය සම්බන්ධව ආරවුලක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර .............<br>.....................................................................................................................................<br>.....................................................................................................................................<br>..................................................................................................................................... | .................................. |
| *13 වන ඇමුණුම* **- බලපත්‍රය පවත්වාගෙන යාමට අයිතිකරුගේ එකඟතාවය**<br>යෝජිත ගොඩනැගිල්ල කුලියට හෝ බද්දට ගෙන තිබේ නම්, ව්‍යාපාරය අවහිරයකින් තොරව පවත්වාගෙන යාමට ඉඩදෙන බවට අයිතිකරු සමඟ එකඟතාවයක් ඇති කර ගත් බවට ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතිකකළ ගිවිසුමක් හෝ ඒ බවට අයිතිකරුගේ දිවුරුම් ප්‍රකාශයක් | .................................. |
| *14 වන ඇමුණුම* **- ගොඩනැගිල්ලේ සෙසු කොටස් භාවිතය**<br>ගොඩනැගිල්ලේ කොටසක් පමණක් භාවිතා කරන අවස්ථාවක එහි අනිකුත් කොටස් භාවිතා කරනුයේ කවරකටදැයි සඳහන් කරන ලද සම්පූර්ණ සැලැස්මේ කටු සටහනක් | .................................. |
| *15 වන ඇමුණුම* **- ගොඩනැගිල්ලේ දළ සැළැස්ම**<br>භාවිතා කිරීමට යෝජිත ගොඩනැගිල්ලේ සහතික කළ දළ සැළැස්ම | .................................. |
| *16 වන ඇමුණුම* **- ගොඩනැගිල්ලේ නිර්මාණය (අදාළ වේ නම්)**<br>ගොඩනැගිල්ලට භාවිතා කර ඇති ද්‍රව්‍යවල විස්තර, බිම, වහල හා බිත්තිය ආදිය ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර නොමැති දැයින් තනා ඇත්නම් ඒ පිළිබඳ විස්තර<br>.....................................................................................................................................<br>..................................................................................................................................... | ..................................<br>..................................<br>.................................. |
| *17 වන අමුණුම* **- වරිපනම් අංකය**<br>පරිශ්‍රයට වරිපනම් අංකයක් දී නොමැති නම් යාබද ගොඩනැගිලිවල අංක සඳහන් කරන්න. ඒවා ද ලබාගත නොහැකි විට යාබද ඉඩමේ /ඉඩම්වල නම් සඳහන් කරන්න.<br>.....................................................................................................<br>..................................................................................................... | ..................................<br>.................................. |
| *18 වන ඇමුණුම* **- ගෙබිම් සැලැස්ම**<br>ප්‍රාදේශීය අධිකාරීන් විසින් සහතික කරන ලද ගෙබිම් සැලැස්ම | .................................. |
| **වෙනත් අවශ්‍යතාවයන්** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *19 වන ඇමුණුම* **- ඉල්ලුම්පත් ගාස්තු ලදුපත**<br>ආපසු නොගෙවන ඉල්ලුම්පත් ගාස්තුව ගෙවීම සනාථ කරන ලදුපතේ ඡායාස්ථිත පිටපතක් සහ ලදුපතේ අංකය හා දිනය<br>(ලදුපත ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය.) | .................................. |
| *20 වන ඇමුණුම* **- බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචිය**<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචි අංකය සනාථ කරන ලේඛන (ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය.) | .................................. |

| | |
|---|---|
| *21 වන ඇමුණුම* - **නියමිත ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීම**<br><br>ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් වෙනත් සුරාබදු බලපත්‍රයක්/ බලපත්‍ර දරන්නේ නම් හෝ දැනටමත් යෝජිත පරිශ්‍රයේ යම් සුරාබදු බලපත්‍රයක් ක්‍රියාත්මක වන්නේ නම් *නැතහොත්* මීට කලින් එහි යම් සුරාබදු බලපත්‍රයක් ක්‍රියාත්මක වී ඇත්නම් හෝ එකී බලපත්‍රය/ බලපත්‍ර වෙනුවෙන් රජයට ලැබීමට නියමිත සියලුම සමථ ගාස්තු හා ප්‍රමාද ගාස්තු ඇතුළු සියලුම ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීම පිළිබඳව අදාළ සහකාර සුරාබදු කොමසාරිස්ගේ සහතිකය | |

| |
|---|
| 1. සුරාබදු කාර්ය ස්ථාන භාර නිළධාරිගේ නිර්දේශයඃ-<br><br><br>නමඃ- අත්සන<br>දිනයඃ- මුද්‍රාවඃ- |
| 2. සුරාබදු අධිකාරිගේ නිර්දේශයඃ-<br><br><br>නමඃ- අත්සන<br>දිනයඃ- මුද්‍රාවඃ- |
| 3. සහකාර සුරාබදු කොමසාරිස් විසින් පිරවිය යුතු වාර්තාවඃ-<br><br><br>නමඃ- අත්සන<br>දිනයඃ- මුද්‍රාවඃ- |

## II වන උපලේඛනය

### ප්‍රවර්තන මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් එළැඹෙන වර්ෂයට අළුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

**බලපත්‍රයේ වලංගු කාලය.........................සිට ......................... දක්වා .....................................**

අයදුම්පත් ගාස්තුව ගෙවූ ලදුපත් අංකය හා දිනයඃ...............................................................

අයදුම්පත නිකුත් කළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාවඃ .............................................

<table>
<tr><td></td><td>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි</td></tr>
<tr><td>ඉල්ලුම්පත හැකිතාක් දුරට නිවැරදිව ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.<br><br>(අ) අදාළ නොවන විකල්පය කපා හැරීමෙන් හෝ (ආ) අදාළ විස්තර පිරවීමෙන් හෝ (ඇ) දැනට අදාළ නොවන්නේ නම් “අදාළ නොවේ” යැයි සඳහන් කරමින් හෝ සම්පූර්ණ කිරීමට</td><td>සුරාබදු සත්‍යාපන ක්‍රියාවලිය<br>සුරාබදු පරීක්ෂක විසින් සම්පූර්ණ කිරීමට<br>(හරි නම් √ ලකුණු කරන්න; වැරදි නම් විස්තර සපයන්න)</td></tr>
<tr><td>1. ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන් පිළිබඳ සාමාන්‍ය විස්තර</td><td>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</td></tr>
<tr><td>ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ නමඃ-..................................................................<br>..................................................................<br>..................................................................<br>..................................................................<br><br>ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ ලිපිනය/ ලිපිනයන්ඃ-<br>..................................................................<br>..................................................................<br>..................................................................<br>..................................................................<br><br>දුරකථන/ ෆැක්ස් ඃ-...................................<br><br>විද්‍යුත් තැපැල ඃ-...................................................................<br>ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකයඃ-...........................<br>(අදාළවේ නම්)</td><td>....................................<br>....................................<br>....................................<br>....................................<br><br>....................................<br>....................................<br>....................................<br>....................................<br><br>....................................<br><br>....................................</td></tr>
<tr><td>(අදාළ වේ නම්) මීට පෙර ඉදිරිපත් කරන ලද ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචිය වෙනස් වී ඇත්නම් එම ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපතක් (අදාළ වේ නම්) 1 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.</td><td></td></tr>
<tr><td>ජාතියඃ ......................................<br>ජාතික හැඳුනුම්පත් අංකයඃ .......................................<br>වයසඃ- ......................................<br>රැකියාවඃ- .......................................</td><td>....................................<br>....................................<br>....................................<br>....................................</td></tr>
<tr><td>මීට පෙර ඉදිරිපත් කරන ලද ලේඛනයට වෙනස් වේ නම් නව ජාතික හැඳුනුම්පතෙහි/ විදේශ ගමන් බලපතෙහි/ රියදුරු බලපතෙහි ජායාස්ථ පිටපතක් 2 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.</td><td></td></tr>
<tr><td>2. බලපත්‍රයට අදාළ විස්තර</td><td>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</td></tr>
</table>

<table>
<tr><td rowspan="2">බලපත්‍ර වර්ගය</td><td colspan="2">බලපත්‍රයේ ස්වභාවය</td><td rowspan="3">....................................<br>....................................<br>....................................<br>....................................</td></tr>
<tr></tr>
<tr><td>සුරාබදු ර.බී ...............</td><td>ස්ථානයෙන් පිටත පරිභෝජනය</td><td>ස්ථානීය පරිභෝජනය</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| 3 වන ඇමුණුම ලෙස, බලපත්‍රය අළුත් කිරීමට අපේක්ෂිත වර්ෂයට පූර්ව වර්ෂය සඳහා ලබාගත් අදාළ සුරාබදු බලපත්‍රයේ/ බලපත්‍රවල සහතික කළ පිටපත් ඉදිරිපත් කරන්න. | | | |
| 3. ඉල්ලුම්කරු බලපත්‍රය ක්‍රියාමක කරනු ලබන පරිශ්‍රයේ භූගෝලීය පිහිටීම පිළිබඳ විස්තර | | | ඉල්ලුම්කරු සමග එකග නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| බලපත්‍ර ලත් ස්ථානයේ තැපැල් ලිපිනය:- ................................ ......................<br>.................................................................................................................<br>.................................................................................................................<br>................................................................................................................. | | | ...................................... |
| දිස්ත්‍රික්කය:- ...........................................<br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:- ...........................................<br>පොලිස් වසම:- ...........................................<br>මැතිවරණ කොට්ඨාසය:- ...........................................<br>සුරාබදු ස්ථාන බලප්‍රදේශය:- ........................................... | | | ......................................<br>......................................<br>......................................<br>......................................<br>...................................... |
| 4. දෙවන පාර්ශ්වයක ලියාපදිංචිය/ නිර්දේශය ලබා ඇත් ද යන්න. | | | ඉල්ලුම්කරු සමග එකග නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| (අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 7,8,11,12,22බී බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | ................................ ...... |
| (ආ) ජාතික චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී.9 බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | |
| (ඇ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 10 බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | ...................................... |
| (ඈ) නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය/නිර්දේශය (සුරාබදු ර.බී. 12 බලපත්‍ර සම්බන්ධයෙන්) | ඔව් | නැත | ...................................... |
| (ඉ) සුරාබදු ර.බී. 13 හා 13ඒ බලපත්‍ර සම්බන්ධයෙන්:- | | | ...................................... |
| i. අදාළ පළාත් පාලන ආයතනයේ 1975 අංක 17 දරන සමාජශාලා පනත යටතේ වන ලියාපදිංචිය/ නිර්දේශය | ඔව් | නැත | ...................................... |
| ii. ක්‍රීඩා අමාත්‍යාංශය/ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ වන ලියාපදිංචිය/නිර්දේශය | ඔව් | නැත | ...................................... |
| iii. අයදුම් කරන වසරට වලංගු සමාජ ශාලා බලපත්‍රයක් තිබේද? | ඔව් | නැත | |
| iv. බැංකු ගිණුමක් සතුව තිබේද? | ඔව් | නැත | |
| v. පසුගිය වසර 5 තුළ සක්‍රියව ක්‍රියාත්මක වූයේ ද? | ඔව් | නැත | |
| (ඊ) වෙනත් අදාළ ආයතනවල ලියාපදිංචිය/නිර්දේශය (අදාළ වේ නම් පමණක්) | ඔව් | නැත | |
| "ඔව්" නම්, අදාළ ලියාපදිංචිය/නිර්දේශය/ කාරණය සනාථ කරන ලේඛන 4 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | | | ...................................... |
| 5. සාපරාධී අපරාධ පිළිබඳ විස්තර | | | ඉල්ලුම්කරු සමග එකග නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| (අ) සාපරාධී අපරාධ හෝ සුරාබදු අපරාධ කිසිවක් සඳහා ඔබ වරදකරු වී තිබේද? | ඔව් | නැත | ...................................... |

<table>
<tr><td colspan="3">ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ නමः-.................................................................<br>.................................................................<br>.................................................................<br>.................................................................<br><br>ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ ලිපිනය/ ලිපිනයන්:-<br>.................................................................<br>.................................................................<br>.................................................................<br>.................................................................<br><br>දුරකතන/ ෆැක්ස් :-...................................<br><br>විද්‍යුත් තැපැල :-...................................................................<br><br>ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය:-...........................<br>(අදාළ වේ නම්)</td><td>..............................<br>..............................<br>..............................<br>..............................<br><br>..............................<br>..............................<br>..............................<br>..............................<br><br>..............................<br><br>..............................</td></tr>
<tr><td colspan="3">ජාතිය: ......................................<br>හැඳුනුම්පත් අංකය: ......................................<br>වයසः- ......................................<br>රැකියාව:- ......................................</td><td>..............................<br>..............................<br>..............................<br>..............................</td></tr>
<tr><td colspan="3">2. ප්‍රවර්තන බලපත්‍රයට අදාළ විස්තර</td><td>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</td></tr>
<tr><td>බලපත්‍ර වර්ගය</td><td colspan="2">බලපත්‍රයේ ස්වභාවය</td><td rowspan="2">..............................<br>..............................<br>..............................<br>..............................</td></tr>
<tr><td>සුරාබදු ර.බී ...............</td><td>ස්ථානයෙන් පිටත පරිභෝජනය</td><td>ස්ථානීය පරිභෝජනය</td></tr>
</table>

<table>
<tr><td colspan="3">(අ) ර. බී. 7 හෝටල් බලපත්‍රයක් නම්,යෝජිත ගොඩනැගිල්ලේ ඇති කාමර ගණන :-</td><td colspan="2">........................</td><td>..............................</td></tr>
<tr><td colspan="3">(ආ) ඉල්ලුම්කරු වෙනත් සුරාබදු බලපත්‍ර දරන්නේද ?</td><td>ඔව්</td><td>නැත</td><td>..............................</td></tr>
<tr><td colspan="2">"ඔව්" නම් බලපත්‍ර වර්ගය</td><td colspan="3">එම බලපත්‍ර ක්‍රියාත්මක වන පරිශ්‍රය</td><td></td></tr>
<tr><td>i</td><td>.......................</td><td colspan="3">.......................................</td><td>..............................</td></tr>
<tr><td>ii</td><td>.......................</td><td colspan="3">.......................................</td><td>..............................</td></tr>
<tr><td>Iii</td><td>.......................</td><td colspan="3">.......................................</td><td>..............................</td></tr>
<tr><td>iv</td><td>.....................</td><td colspan="3">.......................................</td><td>..............................</td></tr>
<tr><td colspan="5">(ඇ) පවත්නා වර්ෂය තුළදී යෝජිත ස්ථානයේ මත්පැන් බලපත්‍රයක් ක්‍රියාත්මක වී තිබේද? ..................<br>.............................<br>"ඔව්"නම්,<br>I. බලපත්‍රධාරියාගේ නම සහ ලිපිනය:- ..................................<br>( ඉහත සඳහනට වෙනස් නම්) :- .......................................<br>........................................................................................<br>........................................................................................<br>........................................................................................<br>........................................................................................<br>II. මෙම පරිශ්‍රයට අදාළව බලපත්‍රය ක්‍රියාත්මකව තිබූ මුළු කාලය :<br>.......................................<br>III. බලපත්‍රය ආරම්භ වූ වර්ෂය :<br>.......................................</td><td>..............................<br>..............................<br>..............................<br>..............................<br>..............................<br>..............................<br>..............................<br>..............................</td></tr>
<tr><td colspan="5">3. ඉල්ලුම්කරු දැනට බලපත්‍රය ක්‍රියාත්මක කරන පරිශ්‍රයේ භූගෝලීය පිහිටීම පිළිබඳ විස්තර</td><td>ඉල්ලුම්කරු සමග එකග නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</td></tr>
<tr><td colspan="5">යෝජිත ස්ථානයේ තැපැල් ලිපිනය:- ............................... ......................<br>..............................................................................................................<br>..............................................................................................................<br>..............................................................................................................</td><td>...............................</td></tr>
<tr><td colspan="5">දිස්ත්‍රික්කය:- ............................................<br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:- ............................................<br>පොලිස් වසම:- ............................................<br>මැතිවරණ කොට්ඨාශය:- ............................................<br>සුරාබදු ස්ථාන බලප්‍රදේශය:- ............................................</td><td>...............................<br>...............................<br>...............................<br>...............................<br>...............................</td></tr>
</table>

<table>
<tr><th>4. ඉල්ලුම්කරු බලපත්‍රය ක්‍රියාත්මක කිරීමට යෝජනාකරන පරිශ්‍රයේ භූගෝලීය පිහිටීම පිළිබඳ විස්තර</th><th>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</th></tr>
<tr><td>යෝජිත ස්ථානයේ තැපැල් ලිපිනයඃ- ................................ .....................<br>..........................................................................................................<br>..........................................................................................................<br>..........................................................................................................</td><td>..............................</td></tr>
<tr><td>දිස්ත්‍රික්කයඃ- ..........................................<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයඃ- ............................................<br><br>පොලිස් වසමඃ- ............................................<br><br>මැතිවරණ කොට්ඨාශයඃ- ............................................<br><br>සුරාබදු ස්ථාන බලප්‍රදේශයඃ- ............................................</td><td>..............................<br><br>..............................<br><br>..............................<br><br>..............................<br><br>..............................</td></tr>
</table>

<table>
<tr><th colspan="4">5. යෝජිත පරිශ්‍රයේ පිහිටීම අනුව එහි සුදුසු බව පිළිබඳ විස්තර</th><th>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</th></tr>
<tr><td rowspan="2">(අ) බලපත්‍ර වර්ගයට නියමිත දුර ප්‍රමාණයට වඩා පහත සඳහන් ස්ථානවලට ඇති දුර ප්‍රමාණය වැඩි වන්නේද?</td><td>රජයේ ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථාන</td><td>ඔව්</td><td>නැත</td><td rowspan="3">..............................<br><br>..............................<br><br>..............................</td></tr>
<tr><td>රජයේ ලියාපදිංචි පාසැල්</td><td>ඔව්</td><td>නැත</td></tr>
<tr><td colspan="4">1 වන ඇමුණුම ලෙස, බලපත්‍රලත් මිනින්දෝරුවෙකුගෙන් ලබාගත් මිනින්දෝරු සැළැස්මක් ඉදිරිපත් කරන්න.</td></tr>
<tr><td colspan="4">(ආ) පරිශ්‍රය පිහිටා ඇත්තේ රටබීම තැබෑරුම් ප්‍රදේශයක් ඇතුළත ද? ..................<br><br>(ඇ) “ඔව්” නම්, ළගම ඇති රටබීම තැබෑරුමේ සිට ඇති දුරඃ-....................</td><td>..............................<br><br>..............................</td></tr>
<tr><td colspan="4">2 වන ඇමුණුම ලෙස, යෝජිත බලපත්‍රය නිකුත් කිරීම සඳහා මහජනයාගේ විරුද්ධතාවක් නොමැති බවට අදාළ පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කරන්න.</td><td></td></tr>
</table>

<table>
<tr><th colspan="3">6. යෝජිත පරිශ්‍ර සඳහා වන දෙවන පාර්ශවයක ලියාපදිංචිය/ නිර්දේශය පිළිබඳ තොරතුරු</th><th>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</th></tr>
<tr><td>(අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය/නිර්දේශය<br>(සුරාබදු ර.බී. 7,8,11,12,22බී බලපත්‍ර සම්බන්ධයෙන්)</td><td>ඔව්</td><td>නැත</td><td rowspan="6">..............................<br><br>..............................<br><br>..............................<br><br>..............................<br><br>..............................<br><br>..............................</td></tr>
<tr><td>(ආ) ජාතික චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචිය/නිර්දේශය<br>(සුරාබදු ර.බී. 9 බලපත්‍ර සම්බන්ධයෙන්)</td><td>ඔව්</td><td>නැත</td></tr>
<tr><td>(ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය/නිර්දේශය<br>(සුරාබදු ර.බී. 12 බලපත්‍ර සම්බන්ධයෙන්)</td><td>ඔව්</td><td>නැත</td></tr>
<tr><td>(ඈ) අදාළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචිය/නිර්දේශය<br>(සුරාබදු ර.බී. 13 හා 13ඒ බලපත්‍ර සම්බන්ධයෙන්)</td><td>ඔව්</td><td>නැත</td></tr>
<tr><td>(ඉ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය/නිර්දේශය<br>(සුරාබදු ර.බී. 10 බලපත්‍ර සම්බන්ධයෙන්)</td><td>ඔව්</td><td>නැත</td></tr>
<tr><td>(ඊ) වෙනත් අදාළ ආයතනවල ලියාපදිංචිය/නිර්දේශය<br>(අදාළ වේ නම් පමණක්)</td><td>ඔව්</td><td>නැත</td></tr>
</table>

| | |
|---|---|
| "ඔව්" නම්, 3 වන ඇමුණුම ලෙස අදාළ ලියාපදිංචිය/නිර්දේශය සනාථ කරන ලේඛන ඉදිරිපත් කරන්න. | ................................ |

| | | | | |
|---|---|---|---|---|
| 7. සාපරාධී පසුබිම පිළිබඳ විස්තර | | | | ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| (උ) පසුගිය වර්ෂ 3 ක් තුළදී ඔබට අදාළව යම් සුරාබදු බලපත්‍රයක් සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කර තිබේද?<br>"ඔව්" නම් පහත විස්තර සපයන්න | | ඔව් | නැත | ..................................... |
| වර්ෂය | කාර්මික අපරාධ වාර්තා අංකය | සමථ ගාස්තුව | | |
| | | | | ..................................... |
| | | | | ..................................... |
| | | | | ..................................... |
| | | | | |

| | | | |
|---|---|---|---|
| 8.යෝජිත පරිශ්‍රයෙහි අයිතිය පිළිබඳ සාක්ෂි, පාවිච්චිය සඳහා අනුමැතිය සහ පරිශ්‍රය පිළිබඳ විස්තර | | | ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න |
| (අ) අයිතියේ ස්වභාවයඃ- | සින්නක්කර | කුලියට | ...................................... |
| ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු විසින් සහතිකකල ලියාපදිංචිකල ඔප්පුවේ/කුලී හෝ බදු ගිවිසුමේ පිටපතක් 4 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | | | ...................................... |
| (ආ) අයිතිය පිළිබඳ ආරවුලක් තිබේ ද? | ඔව් | නැත | ....................................... |
| "ඔව්" නම් 5 වන ඇමුණුම හි විස්තර සපයන්න. | | | ...................................... |
| (ඇ) කුලියට හෝ බද්දට ගෙන ඇති විට, අයිතිකරු විසින් බලපත්‍රය පවත්වා ගෙන යාමට පරිශ්‍රය අනුමතකර ඇත් ද? | ඔව් | නැත | ....................................... |
| "ඔව්" නම්, 6 වන ඇමුණුම ලෙස, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු සහතික කළ අනුමැතිය හෝ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරන්න. | | | ....................................... |
| (ඈ) යෝජිත පරිශ්‍රය, ගොඩනැගිල්ලේ කුමන ස්ථානයක පිහිටියේ ද? | සම්පූර්ණ ගොඩනැගිල්ල | ගොඩනැගිල්ලේ කොටසක/මහලක | ....................................... |
| (ඉ) ගොඩනැගිල්ලේ කොටසක නම්, අනිකුත් තැන් පාවිච්චි කරනුයේ කුමකටදැයි දැක්වෙන මුළු සැළැස්මේ කටු සටහනක් 7 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | | | ....................................... |

<table>
<tr><td colspan="5">(ඊ) බලපත්‍ර පරිශ්‍රයේ මායිම්:-<br><br>උතුරට : ......................................................................................<br><br>දකුණට : ......................................................................................<br><br>නැගෙනහිරට : ............................................................................<br><br>බටහිරට: ......................................................................................</td><td>........................................<br><br>........................................<br><br>........................................<br><br>........................................</td></tr>
<tr><td colspan="5">(උ) ගොඩනැගිල්ලේ විස්තරය පිළිබඳ සහතික කළ දළ සටහනක් 8 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.</td><td>........................................</td></tr>
<tr><td rowspan="4">(ඌ) ගොඩනැගිල්ලේ විස්තරය<br>(අදාළ නොවේ නම් කපා හරින්න.)</td><td>බිම</td><td>සිමෙන්ති</td><td>ටයිල්</td><td>වෙනත්</td><td rowspan="5">ගොඩනැගිල්ල සෑම අතින්ම සුදුසුදැයි අදහස් දක්වන්න.<br>...................................<br><br>.................................<br><br>.................................<br><br>.................................<br><br>.................................<br><br>.................................<br><br>...................................</td></tr>
<tr><td>වහල</td><td>ඇස්බැස්ටෝස්</td><td>උළු</td><td>වෙනත්</td></tr>
<tr><td>බිත්ති</td><td>ගඩොල් සහ බදාම</td><td>පෙර නිමි</td><td>වෙනත්</td></tr>
<tr><td colspan="4">දොරවල්, ජනෙල් සහ වෙනත් වාතාශ්‍රය පිවිසුම් පිළිබඳ විස්තර සපයන්න.<br>..............................................................................<br>..............................................................................<br>..............................................................................<br>..............................................................................</td></tr>
<tr><td colspan="5">ඉහත පිළිතුර "වෙනත්" නම් 9 වන ඇමුණුම හි විස්තර සපයන්න.</td></tr>
<tr><td colspan="5">(එ) ගොඩනැගිල්ලේ වරිපනම් අංකය:- ......................<br>වරිපනම් අංකයක් නොමැති නම්, 10 වන ඇමුණුමෙහි විස්තර දක්වන්න. .....................................<br>..........................................................................</td><td>...............................</td></tr>
<tr><td colspan="5">(ඒ) ගොඩනැගිල්ලේ ගෙබිම් සැළැස්ම සඳහා අනුමැතිය ලබා තිබේද? ....................<br>ප්‍රාදේශීය අධිකාරීන් විසින් සහතික කරන ලද ගෙබිම් සැලැස්ම 11 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.</td><td>...............................</td></tr>
<tr><td colspan="5">9. වෙනත් අවශ්‍යතාවයන්</td><td>ඉල්ලුම්කරු සමඟ එකඟ නොවන්නේ නම් විස්තර ලබා දෙන්න</td></tr>
<tr><td colspan="5">(අ) ආපසු නොගෙවන ඉල්ලුම්පත් ගාස්තුව ගෙවීම සනාථ කරන ලදුපතේ අංකය හා දිනය:- ..........<br>.........................................................................................<br>ලදුපත ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය. ලදුපත 12 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න.<br><br>(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචි වී තිබීම සනාථ කරන ලේඛන 13 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. (එම ලේඛන ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය.)</td><td></td></tr>
</table>

| | |
|---|---|
| (ඇ) ස්ථාන මාරු කිරීමට යෝජිත බලපත්‍රය හෝ ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් වෙනත් සුරාබදු බලපත්‍රයක්/ බලපත්‍ර දරන්නේ නම් හෝ දැනටමත් යෝජිත පරිශ්‍රයේ යම් සුරාබදු බලපත්‍රයක් ක්‍රියාත්මක වන්නේ නම් නැතහොත් මීට කලින් එහි යම් සුරාබදු බලපත්‍රයක් ක්‍රියාත්මක වී ඇත්නම් හෝ එකී බලපත්‍රය/ බලපත්‍ර වෙනුවෙන් රජයට ලැබීමට නියමිත සියළුම සමථ ගාස්තු හා ප්‍රමාද ගාස්තු ඇතුළු සියළුම ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීම පිළිබඳව අදාළ සහකාර සුරාබදු කොමසාරිස්ගේ සහතිකය 14 වන ඇමුණුම ලෙස ඉදිරිපත් කරන්න. | |
| මෙම ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමෙන් පමණක් මට/අපට බලපත්‍රය හිමි නොවන බව සහ ඉහත සඳහන් විස්තර අසත්‍ය බවට සොයා ගත් ඕනෑම අවස්ථාවක හෝ සුරාබදු ආඥාපනත යටතේ දැනට බලාත්මක රීති, නියෝග සහ කඩ කිරීමක් සිදුකළේ නම්, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නියෝග යෙන් බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළහැකි බව ද, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව ද, බලපත්‍රයක් නිකුත් නොකිරීමෙන් ශ්‍රී ලංකා රජයෙන් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කටයුතු කරන නිලධාරියෙකුගෙන් වන්දි ඉල්ලා සිටීමට මට/අපට හිමිකමක් නොමැති බව ද, මම/අපි දන්නා බව ප්‍රකාශ කර සහතික කරමි./කරමු.<br><br>...................................................................<br>ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ අත්සන<br><br>දිනයː- ............................. | සුරාබදු පරීක්ෂකගේ සාමාන්‍ය නිරීක්ෂණ-<br>..................................<br>..................................<br>..................................<br>.................................<br>.................................<br><br>.................................<br>සුරාබදු පරීක්ෂකගේ අත්සන.<br>දිනය ː-<br>............................. |

**ප්‍රවර්තන මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් ස්ථාන මාරු කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයට අදාළව ඉදිරිපත් කළ යුතු ඇමුණුම්**

(ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය)

| | **කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි. සුරාබදු පරීක්ෂක විසින් සම්පූර්ණ කළයුතුය.** |
|---|---|
| **යෝජිත පරිශ්‍රයේ පිහිටීමේ සුදුසුභාවය** | **සුරාබදු පරීක්ෂකගේ නිරීක්ෂණ** |
| *1 වන ඇමුණුම*<br>ළඟම ඇති පූජනීය ස්ථානය සහ පාසලට ඇති දුර ප්‍රමාණයන් දක්වමින්, බලපත්‍රලත් මිනුම්දෝරුවෙකුගෙන් ලබා ගත් මිනුම්දෝරු සැලැස්මක පිටපතක්.<br><br>*2 වන ඇමුණුම*<br>යෝජිත බලපත්‍රය නිකුත් කිරීම සඳහා මහජනයාගේ විරුද්ධතාවක් නොමැති බවට අදාළ පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක්. | ..............................<br><br>.............................. |
| **යෝජිත පරිශ්‍රය සඳහා වූ දෙවන පාර්ශවයක ලියාපදිංචිය/ නිර්දේශය (අදාළ වේ නම් පමණි)** | |
| *3 වන ඇමුණුම*<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය/ ජාතික චිත්‍රපට සංස්ථාව/ නාගරික සංවර්ධන අධිකාරිය/ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව/සහ වෙනත් අදාළ ආයතනවල ලියාපදිංචිය/නිර්දේශය සනාථ කරන ලේඛන. | .............................. |
| **යෝජිත පරිශ්‍රය අයිති බවට සාක්ෂි, භාවිතයට අනුමැතිය සහ පරිශ්‍රයේ විස්තර** | |
| *4 වන ඇමුණුම* **- පරිශ්‍රයේ අයිතිය**<br>ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් සහතික කළ, අයදුම් කරන කාල සීමාව සඳහා වලංගු වූ හා ලියාපදිංචි කළ ඔප්පුවේ /කුලී හෝ බදු ගිවිසුමේ පිටපත | .............................. |
| *5 වනඇමුණුම* **- යෝජිත පරිශ්‍රයෙහි අයිතිය පිළිබඳ ආරවුල්**<br>යෝජිත ගොඩනැගිල්ලේ අයිතිය සම්බන්ධව ආරවුලක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර<br>..............................................................................................<br>..............................................................................................<br>.............................................................................................. | .............................. |
| *6 වන ඇමුණුම* **- බලපත්‍රය පවත්වාගෙන යාමට අයිතිකරුගේ එකඟතාවය**<br>යෝජිත ගොඩනැගිල්ල කුලියට හෝ බද්දට ගෙන තිබේ නම්, ව්‍යාපාරය අවහිරයකින් තොරව පවත්වාගෙන යාමට ඉඩ දෙන බවට අයිතිකරු සමඟ එකඟතාවයක් ඇති කර ගත් බවට ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කළ ගිවිසුමක් හෝ ඒ බවට අයිතිකරුගේ දිවුරුම් ප්‍රකාශයක් | .............................. |
| *7 වන ඇමුණුම* **- ගොඩනැගිල්ලේ සෙසු කොටස් භාවිතය**<br>ගොඩනැගිල්ලේ කොටසක් පමණක් භාවිතා කරන අවස්ථාවක එහි අනිකුත් කොටස් භාවිතා කරනුයේ කවරකටදැයි සඳහන් කරන ලද සම්පූර්ණ සැලැස්මේ කටු සටහනක් | .............................. |
| *8 වන ඇමුණුම* **- ගොඩනැගිල්ලේ දළ සැළැස්ම**<br>භාවිතා කිරීමට යෝජිත ගොඩනැගිල්ලේ සහතික කළ දළ සැළැස්ම | .............................. |
| *9 වන ඇමුණුම* **- ගොඩනැගිල්ලේ නිර්මාණය**<br>ගොඩනැගිල්ලට භාවිතා කර ඇති ද්‍රව්‍යවල විස්තර, බිම, වහල හා බිත්තිය ආදිය ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර නොමැති දැයින් තනා ඇත්නම් ඒ පිළිබඳ විස්තර<br>..............................................................................................<br>.............................................................................................. | ..............................<br>..............................<br>.............................. |
| *10 වන අමුණුම* **- වරිපනම් අංකය**<br>පරිශ්‍රයට වරිපනම් අංකයක් දී නොමැති නම් යාබද ගොඩනැගිලිවල අංක සඳහන් කරන්න. ඒවාද ලබා ගත නොහැකි විට යාබද ඉඩමේ /ඉඩම්වල නම් සඳහන් කරන්න.<br>..............................................................................................<br>.............................................................................................. | ..............................<br>.............................. |

| | |
|---|---|
| *11 වන ඇමුණුම* - **ගෙබිම් සැලැස්ම**<br>ප්‍රාදේශීය අධිකාරීන් විසින් සහතික කරන ලද ගෙබිම් සැලැස්ම | .................................. |
| **වෙනත් අවශ්‍යතාවයන්** | |
| *12 වන ඇමුණුම* - **ඉල්ලුම්පත් ගාස්තු ලදුපත**<br>ආපසු නොගෙවන ඉල්ලුම්පත් ගාස්තුව ගෙවීම සනාථ කරන ලදුපතේ ඡායාස්ථිත පිටපතක් සහ ලදුපතේ අංකය හා දිනය .......................................<br>.......................................................................................................<br>(ලදුපත ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය.) | .................................. |
| *13 වන ඇමුණුම* - **බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචිය**<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචි අංකය සනාථ කරන (ලේඛන ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නිකුත් වී තිබිය යුතුය.) | .................................. |
| *14 වන ඇමුණුම* - **නියමිත ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීම**<br>ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන්ට හෝ යෝජිත පරිශ්‍රයට අදාළ සියලු සුරාබදු බලපත්‍ර වෙනුවෙන් රජයට ලැබීමට නියමිත සමථ ගාස්තු හා ප්‍රමාද ගාස්තු ඇතුළු සියලුම ගෙවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීම පිළිබඳව අදාළ සහකාර සුරාබදු කොමසාරිස්ගේ සහතිකය | |

1. සුරාබදු කාර්ය ස්ථාන භාර නිළධාරීගේ නිර්දේශයः-

නමः- අත්සනः-
දිනයः- මුද්‍රාවः-

2. සුරාබදු අධිකාරිගේ නිර්දේශයः-

නමः- අත්සනः-
දිනයः- මුද්‍රාවः-

3. සහකාර සුරාබදු කොමසාරිස් විසින් පිරවිය යුතු වාර්තාවः-

නමः- අත්සනः-
දිනයः- මුද්‍රාවः-

## VI වන උපලේඛනය

### මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ වන මාර්ගෝපදේශ හා කොන්දේසි

**(1.) මත්පැන් සිල්ලරට විකිණීමේ සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම :**

I. එක් පළාතක් සම්බන්ධයෙන් නිකුත් කළ යුතු පහත සඳහන් වර්ගවලට අයත් මත්පැන් විකිණීම සඳහා වූ සුරාබදු බලපත්‍ර සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ ඒ ඒ පළාත්බද ජනගහණ ඝනත්වය, සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය, මත්පැන් පරිභෝජන රටාව, නීතිවිරෝධී මත්පැන් ව්‍යාප්තිය හා වෙනත් සාමාජීය අවශ්‍යතා අනුවය. එක් එක් පළාත සම්බන්ධයෙන් දැනට උපරිම වශයෙන් නිකුත් කළ හැකි මත්පැන් විකිණීම සඳහා වූ සුරාබදු බලපත්‍ර සංඛ්‍යාව පහත දැක්වෙන පරිදි විය යුතුය.

| පළාත | මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර සංඛ්‍යාව (ර.බී. 04) | සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් සංඛ්‍යාව (ර.බී. 07 ) | සංචාරක මණ්ඩල අනුමැතිය රහිත ආපනශාලා සංඛ්‍යාව (ර.බී. 11) |
|---|---|---|---|
| බස්නාහිර | 418 | 8 | 146 |
| දකුණ | 180 | - | 22 |
| උතුර | 82 | 3 | 21 |
| නැගෙනහිර | 114 | 7 | 16 |
| මධ්‍යම | 257 | 8 | 49 |
| උතුරුමැද | 97 | 4 | 16 |
| වයඹ | 189 | - | 39 |
| ඌව | 92 | 4 | 24 |
| සබරගමුව | 149 | - | 29 |
| එකතුව | 1,578 | 34 | 362 |

II. ඉහත I වන ඡේදයේ සඳහන් සීමා කිරීම් තම සමාගමේ/ ව්‍යාපාරයේ හෝ මව් සමාගමේ/ ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 1,000 ක් ඉක්මවන වෙළඳ සංකීර්ණ/ වෙළඳසැල් වැනි ආයතනයන්ට ලබාදෙන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (සුරාබදු ර.බී.04) සම්බන්ධයෙන් අදාළ නොවේ.

III. දැනටමත් බලපත්‍රයක් ලත් ඉල්ලුම්කරුවෙකුගේ නමින් දිස්ත්‍රික්කයේ ඇතුළත තවත් බලපත්‍රයක් ලබා ගැනීමට කරන ඉල්ලීමක් සලකා බලනුයේ, එම අවසරය දී ඇති සංඛ්‍යාව ඇතුළත වෙනත් සුදුසු ඉල්ලුම්කරුවෙකු නැත්නම් පමණි.

IV. කෙසේ වුවද, දිස්ත්‍රික්කයක් ඇතුළත ඉල්ලුම්කරුවෙකුට බලපත්‍ර දෙකකට වඩා නිකුත් කිරීමෙන් එම දිස්ත්‍රික්කය ඇතුළත මත්පැන් ඒකාධිකාරයකට හෝ අනවශ්‍ය මත්පැන් පාලනයකට හෝ නිදහස් බාධා රහිත සැපයුම් බෙදාහැරීමේ හෝ පරිභෝජනයට හෝ අවහිර ඇති වීමේ තත්වයකට තුඩු දිය හැකි යැයි සුරාබදු කොමසාරිස් ජනරාල් අදහස් කරන්නේ නම්, එක් ඉල්ලුම්කරුවකුට දිස්ත්‍රික්කයක් ඇතුළත බලපත්‍ර දෙකකට වඩා නිකුත් නොකරනු ඇත.

V. දිස්ත්‍රික්කය ඇතුළත හෝ පිටත හෝ බලපත්‍ර දෙකක් ලද ඉල්ලුම්කරුවෙකු විසින්, බලපත්‍රයක් සඳහා කරන ඉල්ලුම්පත් ඇගයීමේ දී සහ සලකා බැලීමේදී සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සුරාබදු ප්‍රතිපත්තියට අහිතකර විය හැකි සියළුම හෝ ඕනෑම ආර්ථික සාධකයක්, සමාජීය සුභසාධනය, සංස්කෘතිය, ආගම, මත්පැන් කර්මාන්තයේ අවශ්‍යතා, සමාජයේ සහ පාරිභෝගිකයාගේ ආරක්ෂාව, ඒකාධිකාරී තත්වයන් සහ මත්පැන් කර්මාන්තය මත සහ පරිභෝජනය මත අනවශ්‍ය බලපෑම් වන කරුණු සලකා බැලිය යුතු අතර, ඔහුගේ අදහසට අනුව අවස්ථානුකූල යැයි හැඟේ නම්, එම ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**(2) දැනට පවතින මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම :**

I. දැනට සුරාබදු බලපත්‍ර දරන්නන්ගේ බලපත්‍ර ස්වයංක්‍රීයව අළුත්වීමට හිමිකම් නොලබන අතර, එකී බලපත්‍රවල වළංගු කාලය අවසන් වන විට, අදාළ බලපත්‍රලාභියා එම බලපත්‍රයෙහි වලංගු කාලය තවදුරටත් දීර්ඝ කිරීමට අදහස් කරන්නේ නම්, ඔහු විසින් සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් දින 30 කට පෙරාතුව තම ඉල්ලුම්පත්‍රය මෙම මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

II. එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රය මෙම මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුව ද, සුරාබදු ආඥාපනතේ දක්වා ඇති වෙනත් යම් නියමයන්ට අනුව ද, සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සළකා බලනු ඇත.

III. දැනටමත් ක්‍රියාත්මකව පවත්වාගෙන එන බලපත්‍රලත් ස්ථානයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා කරන ඉල්ලුම්පත්‍ර එම ස්ථානයේ දැනටමත් ක්‍රියාත්මකව පවතින බලපත්‍රය හෝ මීට කළින් ක්‍රියාත්මකව පැවති බලපත්‍රය හෝ ඉල්ලුම්කරුගේ නමට ඇති වෙනත් බලපත්‍රයක් හෝ වෙනුවෙන් ලැබීමට ඇති සියළුම අයවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබිය යුතුය.

IV. දැනටමත් ක්‍රියාත්මකව පවතින එවැනි බලපත්‍ර සම්බන්ධයෙන් තවමත් විභාග වෙමින් පවතින පරීක්ෂණයක් තිබේ නම්, එම පරිශ්‍රයේම බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉල්ලුම්කරුගේ නමින් වෙනත් බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීම හෝ සලකා බලන්නේ 1990 අංක 17 දරන සුරාබදු (සංශෝධන) පනතට අනුකූලව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් නියම කළ හැකි සමථ ගාස්තුවකට අනුරූප ඇප තැන්පතුවක් මත හා එවැනි පරීක්ෂණයක ප්‍රතිඵලවලට යටත්ව ය.

**(3) දැනට පවතින මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක අයිතිය පැවරීම:**

I. සුරාබදු බලපත්‍රයක බලපත්‍රධාරිත්වය වෙනත් තැනැත්තෙකුට පවරා දීමක් සඳහා වන ඉල්ලීමක් සළකා බලනුයේ ඊට අදාළ ඉල්ලුම්පත්‍ර ගාස්තුව ගෙවා යෝජිත පැවරුම්ලාභියාගේ නමින් ඉල්ලුම්පතක් ලබා ගෙන නිසි පරිදි සම්පූර්ණ කොට අදාළ ලේඛන ද සමග ඉදිරිපත් කිරීමෙන් පසුව හා එම යෝජිත පැවරුම්ලාභියා විසින් බලපත්‍රධාරිත්වය ලැබීම සඳහා සම්පූර්ණ කළ යුතු බවට මෙම රීතිවල සඳහන් සියළු අවශ්‍යතා සපුරන්නේ නම් පමණි.

II. යෝජිත පැවරුම්ලාභියා අදාළ අයිතිය පැවරීම වෙනුවෙන් තත්කාලයෙහි නියම කර ඇති පැවරුම් ගාස්තු ගෙවීමට යටත් විය යුත්තේය.

**(4) දැනට පවතින මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක සමබලපත්‍රධාරිත්වය අයදුම් කිරීම:**

I. කිසියම් සුරාබදු බලපත්‍රයකට අදාළ වර්තමාන බලපත්‍රධාරියාට හෝ බලපත්‍රධාරීන්හට අමතරව වෙනත් අයෙකුහට හෝ අයවළුන්හට සමබලපත්‍රධාරිත්වය ලබාදීම සඳහා වන ඉල්ලීමක් සළකා බලනුයේ ඊට අදාළ ඉල්ලුම්පත්‍ර ගාස්තුව ගෙවා යෝජිත සමබලපත්‍රධාරියාගේ හෝ සමබලපත්‍රධාරීන්ගේ නමින් ඉල්ලුම්පතක් හෝ ඉල්ලුම්පත් ලබා ගෙන නිසි පරිදි සම්පූර්ණ කොට අදාළ ලේඛන ද සමග ඉදිරිපත් කිරීමෙන් පසුව හා එම යෝජිත සමබලපත්‍රධාරියා හෝ සමබලපත්‍රධාරීන් විසින් බලපත්‍රධාරිත්වය ලැබීම සඳහා සම්පූර්ණ කළ යුතු බවට මෙම රීතිවල සඳහන් සියළු අවශ්‍යතා සපුරන්නේ නම් පමණි.

II. යෝජිත සමබලපත්‍රලාභියා අදාළ පැවරීම වෙනුවෙන් තත්කාලයෙහි නියම කර ඇති ගාස්තු ගෙවීමට යටත් විය යුත්තේය.

**(5) දැනට පවතින මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍රයක් ස්ථාන මාරුකිරීම:**

I. මත්පැන් විකිණීම සඳහා සුරාබදු බලපත්‍රයක් ලබාදෙන ලද පරිශ්‍රයක පිහිටීම වෙනස් කිරීමට සාමාන්‍ය තත්ත්වය යටතේ ඉඩ දෙනු නොලැබේ. කෙසේ වෙතත් ස්වාභාවික විපතක් හේතුවෙන් හෝ රජයේ සංවර්ධන කටයුත්තක් හේතුකොට ගෙන හෝ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සාධාරණ යැයි සළකනු ලබන සෙසු බලපත්‍රවලට ඇති ආසන්නතාව හා බලපත්‍රලත් ස්ථානවල අසම ව්‍යාප්තිය ආදී වෙනත් හේතුවක් නිසාත් සුරාබදු බලපත්‍රයක් ලබාදෙන ලද පරිශ්‍රයක පිහිටීම වෙනස් කිරීමට එකී බලපත්‍රය ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්කය තුළ පමණක් ඉඩදිය හැකිය.

II. එසේ වුවද, ඉහත I වගන්තියෙහි දැක්වෙන රීතිය මත්පැන් තොග වෙළඳ බලපත්‍ර සඳහා අදාළ නොවිය යුතුය.

III. මත්පැන් විකිණීම සඳහා සුරාබදු බලපත්‍රයක් ලබාදෙන ලද පරිශ්‍රයක පිහිටීම වෙනස් කිරීමට අවසර ලබාදෙනුයේ යෝජිත පරිශ්‍රය මෙම නිවේදනයේ දැක්වෙන රීති, මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුකූල වන්නේ නම් පමණි.

**(6) ප්‍රවර්තන සුරාබදු බලපත්‍රලත් ස්ථාන පිළිබඳ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම :**

I. දැනටමත් ක්‍රියාත්මකව පවත්වාගෙන එන බලපත්‍රලත් ස්ථානයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර එම ස්ථානයේ දැනටමත් ක්‍රියාත්මකව පවතින බලපත්‍රය හෝ මීට කළින් එහි ක්‍රියාත්මක ව පැවති බලපත්‍රය හෝ ඉල්ලුම්කරුගේ නමට ඇති වෙනත් බලපත්‍රයක් හෝ වෙනුවෙන් ලැබීමට ඇති සියලුම අයවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබීමට යටත්ව සළකා බලනු ලැබිය යුතුය.

II. දැනටමත් ක්‍රියාත්මකව පවතින එවැනි බලපත්‍ර සම්බන්ධයෙන් තවමත් විභාග වෙමින් පවතින පරීක්ෂණයක් වේ නම්, එම පරිශ්‍රයෙහිම බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉල්ලුම්කරුගේ නමින් වෙනත් බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීම හෝ සළකා බැලිය යුත්තේ 1990 අංක 17 දරන සුරාබදු (සංශෝධන) පනතට අනුකූලව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් නියම කළ හැකි සමථ ගාස්තුවකට අනුරූප ඇප තැන්පතුවක් මත හා එවැනි පරීක්ෂණයක ප්‍රතිඵලවලට යටත්ව ය.

**(7) ඉල්ලුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලියකියවිලි :**

සුරාබදු බලපත්‍ර සඳහා වූ ඉල්ලුම්පත් සමග පහත සඳහන් වාර්තා හා ලිපි ලේඛන අතරින් තම ඉල්ලීමට අදාළ වන වාර්තා හා ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට නව සුරාබදු බලපත්‍ර ඉල්ලුම් කරන්නන්හට හා දැනට සුරාබදු බලපත්‍ර දරන ඉල්ලුම්කරුවන්හට නියම කරනු ලැබේ. එම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක, අදාළ නව බලපත්‍ර නිකුත් නොකිරීමටත්, පවතින බලපත්‍ර අළුත් නොකිරීමටත් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කළ යුතුය.

**(අ) නව බලපත්‍ර ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු වාර්තා හා ලිපි ලේඛන :**

I. අදාළ සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී හා සහකාර සුරාබදු කොමසාරිස් ගේ නිර්දේශ ඇතුළත් මෙම රීතීන් වල I වන උපලේඛනය ට අදාළ සුරාබදු බලපත්‍ර ඉල්ලුම්පත්‍රය

II. ප්‍රතිපූරණය කරනු නොලබන ඉල්ලුම්පත්‍ර ගාස්තුව ගෙවූ බවට සාක්ෂි.

III. අයදුම්කරුගේ හෝ අයදුම්කරුවන්ගේ නැතහොත් සමාගමක් නම් එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීමේ ලේඛන.

IV. ඉල්ලුම්කරු හෝ ඉල්ලුම්කරුවන් පසුගිය වර්ෂ පහක කාලය තුළදී දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන අපරාධ වරදක් සම්බන්ධයෙන් හෝ චරිතයට අදාළ වෙනත් වරදක් සම්බන්ධයෙන් හෝ සුරාබදු ආඥාපනත ඇතුළු කිසියම් ආදායම් පනතක් යටතට ගැනෙන වරදක් සම්බන්ධයෙන් හෝ වරදකරුවකු වී නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක්. (මේ සම්බන්ධයෙන් ඊට විරුද්ධ යම් පැමිණිල්ලක් ලැබුණහොත් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව බලපත්‍රයක් ලබාදීම, ප්‍රතික්ෂේප කිරීම හෝ පවතින බලපත්‍රය අවලංගු කිරීම හෝ කළ යුතුය).

V. ඉල්ලුම්කරු පසුගිය අවුරුදු පහක (05) කාලය තුළ දී දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන අපරාධ වරදක් සම්බන්ධයෙන් හෝ චරිතයට අදාළ වෙනත් වරදක් සම්බන්ධයෙන් හෝ සුරාබදු ආඥාපනත ඇතුළු කිසියම් ආදායම් පනතක් යටතට ගැනෙන වරදක් සම්බන්ධයෙන් හෝ වරදකරුවකු වී නොමැති බවට අයදුම්කරුගේ ස්ථිර පදිංචිය පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාගෙන් ලබාගත් වාර්තාවක්.

VI. ඉල්ලුම්කරු එම බලපත්‍රය දැරීමට සුදුසු තැනැත්තකු බවට අයදුම්කරුගේ ස්ථිර පදිංචිය පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් වාර්තාවක්.

VII. ව්‍යාපාර නාම පනත අනුව ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට දී ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කල සමාගම් ලියාපදිංචි සහතිකය.

VIII. යෝජිත පරිශ්‍රයේ අයිතිය සනාථ කිරීමේ ලේඛන (සහතික පිටපත් සමග මුල් ලියකියවිලි හෝ ඔප්පු සාක්ෂි වශයෙන් ඉදිරිපත් කොට අයිතිවාසිකම් ඔප්පු කළ යුතු අතර ඒවායේ සහතික පිටපත් මෙම කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන ගොනුවේ ගොණුගත කිරීම සඳහා ලබාදිය යුතුවේ)

IX. යෝජිත ස්ථානය ඉල්ලුම්කරුට අයත් නොමැති විටදී, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් විධිමත් අයුරින් සහතික කොට ලියාපදිංචි කරන ලද බදු ගිවිසුමක් හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් සහතික කරන ලද කුලී ගිවිසුමක් සමග බදු දීමනා කරුට හෝ කුලී දීමනාකරුට එම යෝජිත පරිශ්‍රයේ ඇති අයිතිය සනාථ කිරීමේ ලේඛන.

X. යෝජිත ස්ථානය උකස් කොට ඇති විටක දී අදාළ මූල්‍ය ආයතනයෙන් ඒ බව සනාථ කෙරෙන ලිපියක්.

XI. රජයට අයත් ඉඩම් හෝ රජය විසින් කොන්දේසි සහගතව හෝ බලපත්‍රයක් මත නැතහොත් හිමිකම් සහතිකයක් මත ලබා දෙන ලද ඉඩම් සම්බන්ධයෙන් වන විට දී යෝජිත ව්‍යාපාරය නිරවුල්ව එම ස්ථානයේ කරගෙන යා හැකි බවට අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් හෝ අදාළ බලධරයා විසින් නිකුත් කරනු ලබන කැමැත්ත ප්‍රකාශිත ලිපියක්.

XII. යෝජිත ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ අයිතිය සම්බන්ධව යම් ආරවුලක් පැන නැගී ඇත්නම් හෝ ගොඩනැගිල්ලට විරුද්ධව අධිකරණ කටයුත්තක් ආරම්භ වී ඇත්නම් හෝ අධිකරණ නියෝගයක් ලබා දී ඇත්නම් ඒවා පිළිබඳ සම්පූර්ණ විස්තර (සහතික කරන ලද ලේඛන ද සමඟ).

XIII. ගොඩනැගිල්ල කුලියට හෝ බද්දට ගෙන තිබේනම් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් සහතික කළ යෝජිත ව්‍යාපාරය අවහිරයකින් තොරව පවත්වා ගෙන යාමට ඉඩ දෙන බවට හිමිකරු විසින් ලබාදෙන දිවුරුම් ප්‍රකාශය.

XIV. බලපත්‍රය ක්‍රියාත්මක වන ස්ථානය යම් බැංකුවකට, යම් ආයතනයකට හෝ මූල්‍ය ආයතනයකට උකස්කර හෝ යම් ඇපයක් ලෙස තබා ඇත්නම් ව්‍යාපාරය අවහිරයකින් තොරව පවත්වා ගෙන යාමට ඉඩ දෙන බවට එම ආයතනය මගින් නිකුත් කරන ලද ලිපියක්.

XV. එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් මහජනයාගේ විරුද්ධත්වයක් නොමැති බවට බලපත්‍ර පරිශ්‍රය පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක්.

XVI. පළාත් පාලන බලධාරීන් විසින් සහතික කරන ලද (ගෙබිම් ප්‍රමාණයේ විස්තර ඇතුළුව) යෝජිත ගොඩනැගිල්ලේ පිඹුරෙහි ඡායාස්ථ පිටපතක්.

XVII. බලපත්‍රය ක්‍රියාත්මක කිරීමට යෝජිත ගොඩනැගිලේලේ හෝ පරිශ්‍රයේ දොර, ජනෙල්, පියගැට පෙලවල්, පිවිසුම් හා පිටවීම් ආදිය ද සටහන් කරන ලද ඒ ඒ ගොඩනැගිලි කොටස්වල මිනුම් ද සහිත වූ ගොඩනැගිල්ලේ දළ සටහනක්.

XVIII. බලපත්‍රය ක්‍රියාත්මක වන්නේ ගොඩනැගිල්ලේ කොටසක නම්, ගොඩනැගිල්ලේ අනිකුත් කොටස් පාවිච්චි කරනුයේ කුමන කාර්යයක් සඳහා ද යන්න සඳහන් කරන ලද සම්පූර්ණ ගොඩනැගිලි සැලැස්මේ දළ සටහනක්.

XIX. යෝජිත ස්ථානයේ වරිපනම් අංකය සනාථ කිරීමේ ලිපි ලේඛන.

XX. යොජිත ගොඩනැගිල්ලේ සිට ළගම ඇති රජයේ ලියාපදිංචි පාසල් හා රජයේ ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලට මායිමෙන් මායිමට ඇති සෘජු දුර ප්‍රමාණයන් දැක්වෙන බලයලත් මිනින්දෝරුවෙකුගෙන් ලබාගත් මිනින්දෝරු සැලැස්මක්.

XXI. පහත දැක්වෙන ආයතනවල ලියාපදිංචි වීමට යටත් ස්ථානයන් සම්බන්ධයෙන් වූ විට එම ආයතනවල ලියාපදිංචි සහතිකය හා නිර්දේශය ：

අ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය
ආ. ජාතික චිත්‍රපට සංස්ථාව
ඇ. නාගරික සංවර්ධන අධිකාරිය
ඈ. පළාත් පාලන ආයතන

XXII. සමාජශාලාවක් නම් ඉහත සඳහන් ලේඛන සහ වාර්තාවලට අමතරව පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කළ යුතුය:

(අ) 1975 අංක 17 දරන සමාජ ශාලා පනත යටතේ ලියාපදිංචි සහතිකය
(ආ) ඉල්ලුම්පත ඉදිරිපත් කළ දිනට වහාම පෙරාතුව වූ අවුරුදු පහ (05) තුළ සමාජශාලාව නොකඩවාම පැවති බවට සනාථ කිරීමට ලේඛන
(ඇ) බැංකු ගිණුමක් පවත්වාගෙන යන බවට සාක්ෂි
(ඈ) ක්‍රීඩා අමාත්‍යාංශයේ/ සමාජ සේවා අමාත්‍යාංශයේ ලියාපදිංචි සහතිකයක්

XXIII. වෙළෙඳ සංකීර්ණ/ වෙළෙඳසැල් වැනි ආයතන සඳහා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර සම්බන්ධයෙන් තම මව් ව්‍යාපාරයේ/ සමාගමේ පසුගිය වර්ෂය සඳහා වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 1,000 ක් ඉක්මවූ බවට පිළිගත් විගණන සමාගමක වාර්තාවක් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ සහතිකයක්.

XXIV. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් ඒ බව තහවුරු කෙරෙන සාක්ෂි.

**(ආ) සුරාබදු බලපත්‍ර අළුත් කරගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වාර්තා හා ලිපි ලේඛන:**

I. ඉහතින් දක්වන ලද මාර්ගෝපදේශ හා කොන්දේසිවල (7) වන වගන්තියේ (අ) වන උප වගන්තියේ I, II, IV,VIII, IX, X, XII, XIII, XIV, XXI යන අනු වගන්ති යටතේ දක්වා ඇති ලේඛන හා වාර්තා.

II. අයදුම් කරනු ලබන වසරට පූර්වගාමී වූ වසර සඳහා සුරාබදු බලපත්‍ර ගාස්තු හා මුද්දර ගාස්තු ගෙවූ බවට සනාථ කෙරෙන සුරාබදු බලපත්‍රයේ සහතික කරන ලද ඡායා පිටපතක්.

III. පූර්වගාමී වසර 03 සම්බන්ධයෙන් වූ අදාළ බලපත්‍රලත් ස්ථානයේ දී සොයා ගන්නා ලද සුරාබදු වැරදි පිළිබඳ සහකාර සුරාබදු කොමසාරිස්ගේ වාර්තාව.

IV. බලපත්‍රයට අදාළ බලපත්‍රධාරීන්ගේ හෝ සමාගමක් නම් එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වෙනස් වීමක් සිදුව ඇත්නම් ඒ බව සනාථ කිරීමේ ලේඛන.

V. බලපත්‍රයක් ක්‍රියාත්මක වන ස්ථානයක් සම්බන්ධයෙන් උද්ගත විය හැකි පහත දැක්වෙන ආකාරයේ අවස්ථාවක දී ඒ බව නොපමාව සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත දැන්වීමට කටයුතු කිරීම බලපත්‍රධාරියාගේ වගකීමක් විය යුතුය:

(අ.) බලපත්‍ර ලත් ස්ථානයේ අයිතිය වෙනස් වීම
(ආ.) යම් බලපත්‍රධාරියෙකු මිය යාම හෝ ව්‍යාපාරයෙන් ඉවත් වීම
(ඇ.) අදාළ බදු ගිවිසුම් හෝ කුළී ගිවිසුම් සම්බන්ධයෙන් වන වෙනස්වීම්
(ඈ.) බලපත්‍රලත් ස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ හෝ පරිශ්‍රයේ සැළැසුම් වල ඇති වන වෙනස් වීම් හෝ වෙනස් කිරීම්
(ඉ.) යම් බලපත්‍රධාරියෙකු ඉහත (7) වන වගන්තියේ (අ) වන උප වගන්තියේ IV වන අනු වගන්තිය යටතේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වරදකරුවකු වීම

**(ඇ) සමබලපත්‍රධාරියෙකු පත්කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු වාර්තා හා ලිපි ලේඛන:**

I. ඉහතින් දක්වන ලද මාර්ගෝපදේශ හා කොන්දේසිවල (7) වන වගන්තියේ (අ) වන උප වගන්තියේ I සිට VI දක්වා වන අනු වගන්ති යටතේ දක්වා ඇති ලේඛන හා වාර්තා.
II. සමබලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා එසේ පත් කිරීම සම්බන්ධයෙන් වන බලපත්‍රධාරියාගේ ඉල්ලීම ඇතුළත් දිවුරුම් ප්‍රකාශය.
III. සමබලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා විසින් තමන් එසේ පත් කිරීමට කැමැත්ත ප්‍රකාශිත දිවුරුම් ප්‍රකාශය.
IV. සමබලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා බලපත්‍රධාරියාගේ නෛතික උරුමකරුවකු නම් ඒ බව සනාථ කිරීමේ ලේඛන.
V. සමබලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා බලපත්‍රධාරියාගේ නෛතික උරුමකරුවකු නොවන විට දී තත්කාලයෙහි බලපවත්නා බලපත්‍ර පැවරුම් ගාස්තුව ගෙවීමට යටත් විය යුතුය.

**(ඈ) සුරාබදු බලපත්‍රයක අයිතිය පැවරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු වාර්තා හා ලිපි ලේඛන:**

I. ඉහතින් දක්වන ලද මාර්ගෝපදේශ හා කොන්දේසිවල (7) වන වගන්තියේ (අ) වන උප වගන්තියේ I සිට VI දක්වා, VIII සිට XIV දක්වා සහ XXI, XIII, XXIII, XXIV යන අනු වගන්ති යටතේ දක්වා ඇති ලේඛන හා වාර්තා.

II. බලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා එසේ පත් කිරීම සම්බන්ධයෙන් වන වර්තමාන බලපත්‍රධාරියාගේ ඉල්ලීම ඇතුළත් දිවුරුම් ප්‍රකාශය

III. බලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා විසින් තමන් එසේ පත් කිරීමට කැමැත්ත ප්‍රකාශිත දිවුරුම් ප්‍රකාශය.

IV. බලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා වර්තමාන බලපත්‍රධාරියාගේ නෛතික උරුමකරුවකු නම් ඒ බව සනාථ කිරීමේ ලේඛන.
V. බලපත්‍රධාරියෙකු ලෙස පත්කිරීමට යෝජිත පුද්ගලයා වර්තමාන බලපත්‍රධාරියාගේ නෛතික උරුමකරුවකු නොවන විට දී තත්කාලයෙහි බලපවත්නා බලපත්‍ර පැවරුම් ගාස්තුව ගෙවීමට යටත් විය යුතුය.

VI. යම් බලපත්‍රධාරියෙකුගේ හෝ සමබලපත්‍රධාරියෙකුගේ ඇවෑමෙන් අදාළ බලපත්‍රධාරිත්වයට හෝ සම බලපත්‍රධාරිත්වයට තමන් පත් කරන ලෙසට නෛතික උරුමකරුවකු විසින් ඉල්ලීමක් කරනු ලැබීමේදී පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුවේ:

a. අදාළ බලපත්‍රධාරියාගේ නැතහොත් සමබලපත්‍රධාරියාගේ මරණ සහතිකයේ සහතික පිටපතක්

b. අයදුම්කරුහට මියගිය බලපත්‍රධාරියාගේ නැතහොත් සමබලපත්‍රධාරියාගේ සුරාබදු බලපත්‍රය හා බලපත්‍ර ලත් ස්ථානය ඇතුළු දේපළ පිළිබඳ නෛතික උරුමකාරිත්වයක් පවතින බව සනාථ කිරීමේ ලේඛන

c. අදාළ බලපත්‍රධාරියාගේ නැතහොත් සමබලපත්‍රධාරියාගේ අන්තිම කැමැති පත්‍රයක් තිබේ නම් ඒට අනුව අයදුම්කරු හට සුරාබදු බලපත්‍රය හා බලපත්‍රලත් ස්ථානය ඇතුළු දේපළ බෙදී යාම සම්බන්ධයෙන් ඇති අයිතිය පිළිබඳව අධිකරණය විසින් ලබා දී ඇති යම් නියෝගයක් වේ නම් එහි සහතික පිටපතක්

VII. පූර්වගාමී වසර 03 සම්බන්ධයෙන් වූ අදාළ බලපත්‍රලත් ස්ථානයේ දී සොයා ගන්නා ලද සුරාබදු වැරදි පිළිබඳ සහකාර සුරාබදු කොමසාරිස්ගේ වාර්තාව.

**(ඉ) සුරාබදු බලපත්‍රයක් පිහිටි ස්ථානය මාරුකිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු වාර්තා හා ලිපි ලේඛනඃ**

1. ඉහතින් දක්වන ලද මාර්ගෝපදේශ හා කොන්දේසිවල (7) වන වගන්තියේ (අ) වන උප වගන්තියේ I, II, VI සහ VIII සිට XXI දක්වා යන අනු වගන්ති යටතේ දක්වා ඇති ලේඛන හා වාර්තා.

2. පූර්වගාමී වසර 03 සම්බන්ධයෙන් වූ අදාළ බලපත්‍රලත් ස්ථානයේ දී සොයා ගන්නා ලද සුරාබදු වැරදි පිළිබඳ සහකාර සුරාබදු කොමසාරිස්ගේ වාර්තාව.

## VII වන උපලේඛනය

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවන ස්ථානීය පරිභෝජනය සඳහා මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථානවල පරිශ්‍රයේ පිහිටීම හා ස්ථානගත කිරීමට අදාළ ආපනශාලා/ හෝටල් අනුමත කිරීම සඳහා වූ නිර්ණායක.**

1. **පිහිටීම පිළිබඳ නිර්ණායකඃ**

(අ) පිහිටීම සහ අවට පරිසරය ආපනශාලාවක්/ හෝටලයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා සුදුසු විය යුතුය.

(ආ) ගොඩනැගිල්ලේ පෙනුම සහ ඉදිකිරීම් හොඳ තත්වයේ තිබිය යුතුය.

2. **ගෙබිම් ප්‍රමාණය පිළිබඳ නිර්ණායකඃ**

(අ) ගෙබිම් ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 500 ක් විය යුතුය.

(ආ) එක් වරකට යටත් පිරිසෙයින් පුද්ගලයන් 25 කට වත් අසුන් ගැනීමට හැකිවන පරිදි පුටු, සහ මේස පිළිවෙලකට තැබිය හැකි තරම් ඉඩ පහසුකම් තිබිය යුතුය.

3. **ගොඩනැගිල්ල පිළිබඳ නිර්ණායකඃ**

(අ) පරිශ්‍රයේ සියලු කොටස් ඇතුළුව ගේ දොර (එනම්, ගොඩනැගිල්ල, ගෘහ භාණ්ඩ, දොර ජනෙල් රෙදි, උපකරණ ගෙයි සවි කොට ඇති බඩු රාක්ක තිරවුරු ආදිය) උසස් මට්ටමින් නියමාකාරයෙන් නඩත්තු කළ යුතුය.

(ආ) ප්‍රමාණවත් තරම් විදුලි පංකා හෝ වායු සමීකරණ පහසුකම් හෝ තිබිය යුතුය.

(ඇ) මේස හා පුටු ඇතුළු සියළු ගෘහ භාණ්ඩ, පහසුකම් හා උපකරණ සියල්ල යෝග්‍ය හා උසස් මට්ටමින් තිබිය යුතුය.

(ඈ) නියම ආකාරයට වාතාශ්‍රය ලැබීමේ පහසුකම් සලසා තිබිය යුතුය.

(ඉ) සජීවී හෝ පටිගත කළ සංගීතය ශ්‍රවණය කිරීමේ පහසුකම් තිබිය යුතුය.

(ඊ) ගේ දොර සහ ඊට අයත් ඉඩකඩ ඉතා කුඩා ප්‍රාණීන්, කෘමීන්, සහ ලැටිගාන වර්ගයේ සතුන්ගෙන් තොර විය යුතුය.

4. **මුළුතැන්ගෙයඃ**

(අ) මුළුතැන්ගෙය සංග්‍රහ කිරීමේ ස්ථානයෙන් වෙන්ව තිබිය යුතු අතර, පිරිසිදුව නඩත්තු කළ යුතුය.

(ආ) පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු, පිහියා සහ වීදුරු බඩු ද උසස් වර්ගයේ ඒවා විය යුතු අතර, කැඩුණු බිඳුනු ඒවා නොවිය යුතුය.

(ඇ) මේස රෙදි උසස් වර්ගයේ රෙදි වලින් පිළියෙල කර ගත් ඒවා විය යුතු අතර, පිරිසිදුවට ද තිබිය යුතුය.

(ඈ) මුළුතැන්ගෙය සහ පැන්ට්‍රිය කාර්යක්ෂම ලෙස සහ සනීපාරක්ෂක ලෙස ආහාර පිළියෙල කර ගත හැකි පරිදි අවශ්‍ය භාණ්ඩ සපයා මැනවින් සැලසුම් කර තිබිය යුතු අතර, එය පිරිසිදුව සහ සනීපාරක්ෂක ලෙස මනාව නඩත්තු කළ යුතුය.

(ඉ) මුළුතැන්ගෙය සුදුසු දැව, ගෑස්, පෝරණු, විදුලි උඳුන්/ කුකර් ආදියෙන් සමන්විතව තිබිය යුතුය.

(ඊ) මුළුතැන්ගෙයි බිම් සහ බිත්ති දව උරා නොගන්නා ද්‍රව්‍ය වලින් තනා පිරිසිදුව තිබිය යුතුය.

(උ) මුළුතැන්ගෙයි උපකරණ ප්‍රමාණවත් සහ උසස් වර්ගයේ ඒවා විය යුතු අතර, පිරිසිදුවට ද තිබිය යුතුය.

(ඌ) මුළුතැන්ගෙයි මේස රාක්ක, උසස් වර්ගයේ ද්‍රව්‍ය වලින් තනා තිබිය යුතු අතර, දව උරා නොගන්නා අයුරින් නිම කර තිබිය යුතුය.

(එ) ප්‍රමාණවත් තරම් ශීතකරණ හා ශීත ගබඩා පහසුකම් තිබිය යුතුය.

(ඒ) පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු, පිහියා, කෑම මේසයේ බඳු මුට්ටු, කෑම පිසින භාජන, උපකරණ, හැලි වලං ආදිය සේදීම සඳහා වෙනම පහසුකම් තිබිය යුතුය.

(ඔ) කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ගේ අත් සෝදා පිරිසිදු කර ගැනීමට වෙනම පහසුකම් තිබිය යුතුය.

(ඕ) පිඟන් ආදිය සෝදන බක්කියේ සිට මුලුතැන්ගෙයි ජලය බැස යන නල සහ පිටවී යන කාණු මනා තත්ත්වයෙන් තිබිය යුතු අතර, ඒවා ගොඩනැගිල්ල තුළදී නිරාවරණය නොවී තිබිය යුතුය.

5. ආහාරඃ

(අ) අමුත්තන්ට පිළිගන්වන ආහාර උසස් තත්ත්වයෙන් යුතු, සෞඛ්‍යමය හා පිරිසිදු ඒවා විය යුතුය.

(ආ) ආපනශාලා/ හෝටල විවෘතව තබන විට සංග්‍රහ කිරීම සඳහා අවශ්‍ය ආහාර සෑම විටම තිබිය යුතුය.

(ඇ) පානීය ජලය උණු කර පෙරා නැතහොත් වෙනත් අයුරකින් පානයට සුදුසු පරිදි සෑම විටම සකස්ව තිබිය යුතුය.

6. **වැසිකිළි පහසුකම් පිළිබඳ නිර්ණායකඃ**

(අ) ගැහැණු සහ පිරිමි අය වෙනුවෙන් වෙන් කර ඉදිකරන ලද නවීන සනීපාරක්ෂක පහසුකම් සහිත වැසිකිළි තිබිය යුතුය.

(ආ) වැසිකිළි විශිෂ්ඨ තත්ත්වයෙන් නඩත්තු කළ යුතු අතර, එහි සියලු සවිකිරීම් හා උපකරණයන් මනා ක්‍රියාකාරීතත්ත්වයෙන් තිබිය යුතුය.

(ඇ) වැසිකිළි සියල්ලටම නළ ජලය, සබන් හා තුවා ආදිය සපයා තිබිය යුතුය.

(ඈ) කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය පිණිස නවීන සනීපාරක්ෂක පහසුකම් සහිත වෙනම වැසිකිළි තිබිය යුතුය.

7. **මත්පැන් ගබඩාව හා මත්පැන් පීඨිකාව පිළිබඳ නිර්ණායකඃ**

(අ) සුදුසු හා ප්‍රමාණවත් ඉඩකඩ සහිත අගුළුලා සුරක්ෂිතව වසා තැබිය හැකි ස්ථානයක් මත්පැන් ගබඩාව සඳහා වෙන් කර තැබිය යුතුය.

(ආ) එම පරිශ්‍රයෙහි මත්පැන් පීඨිකාවක් ද පිහිටුවීමට යෝජිත වන්නේ නම්, එම මත්පැන් ගබඩාව හැකිතාක් එම මත්පැන් පීඨිකාව ආසන්නයෙහි ස්ථාන ගත කළ යුතුය.

(ඇ) මත්පැන් පීඨිකාව අවශ්‍ය පරිදි අගුළුලා සුරක්ෂිතව වසා තැබිය හැකි ආකාරයට සකසා තිබිය යුතුය.

(ඈ) මත්පැන් පීඨිකාව තුළ වීදුරු භාණ්ඩ, හැඳි, ගෑරුප්පු, පිහියා හා අත් පිස්නා ආදිය ප්‍රමාණවත් පරිදි තිබිය යුතු අතර, ඒවා සේදීමේ හා පිරිසිදුව තබා ගැනීමට ප්‍රමාණවත් ජල පහසුකම් හා ශීතකරණ පහසුකම් ද තිබිය යුතුය.

8. **සාමාන්‍යඃ**

(අ) පරිශ්‍රයේ ශෝභාවත්, සිත් ඇළුම් කරන ආකාරයේ වාතාවරණයක් තිබිය යුතුයි.

(ආ) මත්පැන් විකිණීමේ සුරාබදු බලපත්‍ර ලබාදීමේ දී සුරාබදු ර.බී. 7 හෝටල් බලපත්‍රයක් ලබාදීම පිණිස සළකා බැලීම පිණිස අවම වශයෙන් කාමර 5 ක් වත් තිබිය යුතුවේ.

(ඇ) මත්පැන් විකිණීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස සහකාර සුරාබදු කොමසාරිස්, සුරාබදු අධිකාරී සහ ස්ථාන භාර සුරාබදු ස්ථානාධිපති යන අයගෙන් සමන්විත කමිටුවක් මඟින් මෙම උපලේඛනයෙහි සඳහන් නියමයන් පිළිබඳව අනුකූලතා සහතිකයක් VIII වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය උපයෝගී කරගනිමින් නිකුත් කරනු ඇත.

## VIII වන උපලේඛනය

### සුරාබදු නිළධාරින් විසින් නිකුත් කරන අනුකූලතා සහතිකය

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවන ස්ථානීය පරිභෝජනය සඳහා මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර ලත් ස්ථාන හෝ ඒ සඳහා යෝජිත ස්ථානවල පරිශ්‍රයේ පිහිටීම හා ස්ථානගත කිරීමට අදාළ ආපනශාලා/ හෝටල් අනුමත කිරීම සඳහා වූ නිර්ණායක පිළිබඳව සුරාබදු නිළධාරින් විසින් නිකුත් කරන අනුකූලතා සහතිකය.**

| |
|---|
| **1. සුරාබදු කාර්ය ස්ථාන භාර නිළධාරි විසින් පිරවිය යුතු වාර්තාවඃ-**<br><br>ගොඩනැගිල්ලේ සාමාන්‍ය යෝග්‍යතාවය පිළිබඳ නිරීක්ෂණ සහ සුරාබදු අවශ්‍යතා අනුව ගොඩනැගිල්ලට කළ යුතු වෙනස් කිරීම් සම්බන්ධ නිර්දේශඃ-<br><br>අත්සනඃ-<br><br>නමඃ-<br><br>දිනයඃ-<br><br>මුද්‍රාවඃ- |
| **2. සුරාබදු අධිකාරි විසින් පිරවිය යුතු වාර්තාවඃ-**<br><br>ගොඩනැගිල්ලේ සාමාන්‍ය යෝග්‍යතාවය පිළිබඳ නිරීක්ෂණ සහ සුරාබදු අවශ්‍යතා අනුව ගොඩනැගිල්ලට කළ යුතු වෙනස් කිරීම් සම්බන්ධ නිර්දේශඃ-<br><br>අත්සනඃ-<br><br>නමඃ-<br><br>දිනයඃ-<br><br>මුද්‍රාවඃ- |
| **3. සහකාර සුරාබදු කොමසාරිස් විසින් පිරවිය යුතු වාර්තාවඃ-**<br><br>ගොඩනැගිල්ලේ සාමාන්‍ය යෝග්‍යතාවය පිළිබඳ නිරීක්ෂණ සහ සුරාබදු අවශ්‍යතා අනුව ගොඩනැගිල්ලට කළ යුතු වෙනස් කිරීම් සම්බන්ධ නිර්දේශඃ-<br><br>අත්සනඃ-<br><br>නමඃ-<br><br>දිනයඃ-<br><br>මුද්‍රාවඃ- |

EOG 01 - 0110/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.